එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව
කොන්සියුලර් කටයුතු කාර්යාංශය

# 2015 වර්ෂයේ විවිධත්ව සංක්‍රමණික වීසා වැඩසටහන සඳහා උපදෙස් (DV- 2015)

**වැඩ සටහන් පරිදර්ශනය**

රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් කොංග්‍රසීය නියෝග වලට අනුව විවිධත්ව සංක්‍රමණික වීසා වැඩ සටහන වාර්ෂික පදනමකින් ක්‍රියාත්මක කරනු ලැබේ. සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ (INA) 203 (ඇ) වගන්තිය යටතේ ඓතිහාසික ව එක්සත් ජනපදයට අඩු සංක්‍රමණිකයන් ප්‍රමාණයක් පැමිණ ඇති රටවලන් "විවිධත්ව සංක්‍රමණිකයන්" ලෙස හඳුන්වනු ලබන සංක්‍රමණිකයන් කොටසකට ඉඩ සලසයි. 2015 මුදල් වර්ෂය සඳහා විවිධත්ව වීසා (DV) 50,000 ක් ලබාගත හැකිවේ. විවිධත්ව වීසා වැඩසටහනට ලියාපදිංචිවීමේ පිරිවැයක් නැත.

විවිධත්ව වීසාවක් සඳහා සුදුසුකම් ලැබීමට ලොතරැයියෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් සරල වුවද, දැඩි යෝග්‍යතා අවශ්‍යතාවන් සපුරාලිය යුතුය. පරිගණකයෙන් මෙහෙයවන අහඹු ලොතරැයි ඇදීමකින් විවිධත්ව වීසා සඳහා පුද්ගලයන් තෝරා ගනු ලැබේ. මෙම වීසා භූගෝලීය ප්‍රදේශ හයක් අතර බෙදා දෙන අතර, කිසිම රටකට එම වර්ෂය තුල ලබාදෙන විවිධත්ව වීසාවලින් සියයට 7කට වඩා නොලැබේ.

පසුගිය අවුරුදු පහ තුල මෙම රට වලින් එක්සත් ජනපදයට 50,000කට වැඩියෙන් සංක්‍රමණිකයන් පැමිණි ඇති බැවින්, පහත සඳහන් රටවල වැසියන්, DV-2015 සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

> **බංගලාදේශය, බ්‍රසීලය, කැනඩාව, චීනය (ප්‍රධාන දේශයෙහි උපන්) කොළම්බියාව, ඩොමිනිකන් සමූහාණ්ඩුව, ඉක්වදෝරය, එල්සැල්වදෝරය, හයිටි, ඉන්දියාව, ජැමෙයිකාව, මැක්සිකෝව, නයිජීරියාව, පකිස්තානය, පේරු, පිලිපීනය, දකුණු කොරියාව, එක්සත් රාජධානිය (උතුරු අයර්ලන්තය හැර) සහ එහි යටත් ප්‍රදේශ හා වියට්නාමය.**
>
> හොංකොං (විශේෂ පරිපාලන කලාපය) මකාවු (විශේෂ පරිපාලන කලාපය) හා තායිවානයේ උපන් අය සුදුසුකම් ලබයි.

මෙම වර්ෂයේ සුදුසුකම් පිළිබඳ වෙනස්කම්: DV-2015 සඳහා නයිජීරියාවේ වැසියන් තවදුරටත් සුදුසුකම් නොලබයි.

**සුදුසුකම්**

අවශ්‍යතා #1: වැසියන් සුදුසුකම් ලබන රටවල උපන් පුද්ගලයන් ඇතුල්වීමට සුදුසුකම් ලබයි.

ඔබ සුදුසුකම් ලබන රටක ඉපදී නැත්නම් ඔබට සුදුසුකම් ලැබිය හැකි වෙනත් මාර්ග දෙකක් තිබේ.

- ඔබේ කලත්‍රයා ඉපදී ඇත්තේ වැසියන් සුදුසුකම් ලබන රටකද? එසේනම්, ඔබට ඔබගේ කලත්‍රයාගේ උපන් රට යටතේ ඉල්ලුම් කළ හැකියි. මෙසේ කළ හැකි වන්නේ ඔබේත් ඔබේ කලත්‍රයාගේත් නම් තෝරාගත් අයදුම්පතේ තිබී විවිධත්ව වීසා නිකුත් කර, දෙදෙනාම එක්වර එක්සත් ජනපදයට ඇතුළු වන්නේ නම් පමණි.

- ඔබ උපන්නේ, එහි වැසියන් සුදුසුකම් නොලබන රටක වුවත්, ඔබගේ දෙමාපියන්ගෙන් එක් අයෙකුවත් එහි ඉපදී නැත්නම් හෝ ඔබ උපදින අවස්ථාවේදි එහි පදිංචිව නොසිටියේ නම්, දෙමාපියන් උපන් රටවල වැසියන් DV-2015 වැඩසටහන සඳහා සුදුසුකම් ලබන්නේ නම් ඔබට ඒ එකක ජාතිකත්වයට හිමිකම් කිව හැකිය. මෙයින් අදහස් කරන්නේ කුමක්දැයි යන්න පිළිබඳ වැඩි විස්තර සඳහා <u>නිති අසන පැන</u> බලන්න

අවශ්‍යතා #2: මෙයට අමතරව විවිධත්ව වීසා (DV) වැඩසටහනේ අධ්‍යාපන සුදුසුකම් හෝ වැඩ පළපුරුදු සුදුසුකම් සපුරාලීම සඳහා ඔබ

- මූලික හා ද්විතීයික අධ්‍යාපනය පිළිබඳ වර්ෂ 12ක පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇති බවට අර්ථ දක්වන උසස් පාඨශාලා අධ්‍යාපනයක් හෝ ඊට සමාන අධ්‍යාපනයක්

හෝ

- වසර 02 පුහුණුවක් හෝ වැඩ පළපුරුද්ද අවශ්‍ය වන රැකියාවක පසුගිය වර්ෂ 05 තුළ අවුරුදු 02 ක වත් පළපුරුද්දක් ලබා තිබිය යුතුය. සුදුසුකම් ලබන වැඩ පළපුරුද්ද නිර්ණය කිරීම සඳහා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව <u>O*NetOnLine</u> දත්ත සමුදාය යොදා ගනු ඇත.

ප්‍රධාන අයදුම්කරුගේ සුදුසුකම් ලබන වැඩ පළපුරුද්ද පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා <u>නිති අසන පැන</u> බලන්න

<u>මෙම අවශ්‍යතා දෙකම ඔබට සපුරාලිය නොහැකි නම් ඔබ මෙම (DV) වැඩසටහන යටතේ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් **නොකල** යුතුය.</u>

**ඇතුල්වීමේ කාලසීමාව**

DV-2015 විවිධත්ව වීසා ලොතරැයිය සඳහා අයදුම්පත් 2013 ඔක්තෝබර් 01 වැනි අඟහරුවාදා නැගෙනහිර දිවාකාල මධ්‍යාහ්නයේ (EDT) (GMT -4) සිට 2013 නොවැම්බර් 02 වැනි සෙනසුරාදා නැගෙනහිර දිවාකාල වේලාවෙන් මධ්‍යාහ්නය (EDT) (GMT-4) දක්වා අතර කාලයේදී www.dvlottery.state.gov වෙබ් අඩවියට ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කළ යුතුය. දැඩි ඉල්ලුම නිසා වෙබ් අඩවියෙහි ප්‍රමාදයන් ඇති විය හැකි බැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීමට ලියාපදිංචි කිරීමේ කාලසීමාවේ අවසාන සතිය තෙක් පමා නොකරන්න. ප්‍රමාදවූ අයදුම්පත් හෝ කඩදාසිවල ලියූ අයදුම්පත් බාරගනු නොලැබේ. සෑම ලියාපදිංචි කාලයක් තුළම එක් පුද්ගලයෙකුට නීතියෙන් ඉඩදී ඇත්තේ එක් අයදුම්පතකට පමණි. බහු අයදුම්පත් අනාවරණය කර ගැනීම සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුව සූක්ෂම තාක්ෂණයක් යොදා ගනී. **එක් අයදුම්පතකට වඩා ඉදිරිපත් කළහොත් ඔබ නුසුදුස්සෙකු කෙරෙනු ඇත.**

**DV-2015 සඳහා ඉලෙක්ට්‍රොනික අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීම**

ඔබේ ඉලෙක්ට්‍රොනික විවිධත්ව වීසා අයදුම්පත (E-DV අයදුම්පත හෝ DS-5501) www.dvlottery.state.gov වෙත ඉදිරිපත් කරන්න. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. විවිධත්ව වීසා (E-DV) වැඩසටහනට ලියා පදිංචිවීමේ ගාස්තුවක් නැත.

අයදුම්පත් ඉදිරිපත් කිරීමට සේවා සපයන 'වීසා උපදේශකයන්', වීසා ඒජන්තවරුන් හෝ අනිකුත් පහසුකම් සපයන පුද්ගලයන්ගේ සහාය නොමැතිව තමාම අයදුම්පත සම්පූර්ණ කරන ලෙස තදින්ම දිරි ගන්වනු ලැබේ. ඔබේ අයදුම්පත සම්පූර්ණ කිරීමට වෙනත් කෙනෙකුගේ සේවය ලබාගන්නේ නම්, එය පිළියෙල කරන අවස්ථාවේ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සැපයීමට ඔබ සිටිය යුතු අතර, තහවුරු කිරීමේ පිටුව හා ඔබේ අනුපම තහවුරු අංකය ඔබ ළඟ තබා ගත යුතුය. මෙම තොරතුරු නොමැති නම් ඔබේ අයදුම්පතේ තත්වය දැන ගැනීම සඳහා සබැඳි පද්ධතියට ප්‍රවේශ වීමට ඔබට නොහැකි වනු ඇත. ඔබ

වෙනුවෙන් මෙම තොරතුරු ඔවුන් ළඟ තබා ගැනීමට යමෙක් ඉදිරිපත් වුවහොත් ඒ ගැන පරීක්ෂාකාරීව සිතන්න. විවිධත්ව වීසා වංචා පිළිබඳව වැඩිදුර දැන ගැනීමට නිති අසන පැන බලන්න.

සම්පූර්ණ අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු ඔබගේ නම හා සුවිශේෂී තහවුරු අංකයක් සහිත තහවුරු කිරීමේ තිරයක් දිස්වෙනු ඇත.ඔබගේ වාර්තා සඳහා මෙම තහවුරු තිරය මුද්‍රණය කර ගන්න. 2014 මැයි 01 වනදා සිට www.dvlottery.state.gov වෙබ් අඩවියේ *Entrant Status Check* (ප්‍රවේශ තත්ව පරීක්ෂාව) ක්ලික් කර ඔබේ සුවිශේෂී තහවුරු අංකය හා අනිකුත් පුද්ගලික තොරතුරු ඇතුල් කිරීමෙන් ඔබේ ඉල්ලුම්පත්‍රය පිළිබඳ තත්වය දැනගත හැකිවේ. ඔබ DV-2014 සඳහා තේරී ඇත්දැයි දැනුම් දීම, ඔබ ඉල්ලුම් පත පිළිබඳව ක්‍රියාකළ යුතු ආකාරය ගැන උපදෙස් දීම, ඔබේ සංක්‍රමණ වීසා සම්මුඛ පරීක්ෂණය පිළිබඳව දැන්වීම ආදි සියල්ල දැනුම්දීම සඳහා එකම ක්‍රමය වන්නේ මෙම (*Entrant Status Check*) ප්‍රවේශ තත්ව පරීක්ෂාවයි. තෝරාගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ වැඩි විස්තර ලබාගැනීමට කරුණාකර නිති අසන පැන සමාලෝචනය කරන්න.

ඔබේ ඉලෙක්ට්‍රොනික විවිධත්ව වීසා (E-DV) අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ඔබ පහත දැක්වෙන තොරතුරු සැපයිය යුතුය.

1. **නම :** අවසන්/පවුලේ නම, පළමු නම, මැද නම -ඔබේ ගමන් බලපත්‍රයේ සඳහන් ආකාරයටම

2. **උපන් දිනය :** දිනය, මාසය, වර්ෂය

3. **ස්ත්‍රී පුරුෂ භාවය :** පුරුෂ හෝ ස්ත්‍රී

4. **ඔබ උපන් නගරය:**

5. **ඔබ උපන් රට :** ඔබ උපන් ප්‍රදේශයට දැනට භාවිත කරනු ලබන නම භාවිතා කරන්න..

6. **DV වැඩසටහනට සුදුසුකම් ලබන රට :** සාමාන්‍යයෙන් සුදුසුකම් ලබන රට ඔබ උපන් රටයි. ඔබ සුදුසුකම් ලබන රට, ඔබ ජීවත් වන රටට සම්බන්ධයක් නැත. සුදුසුකම් නොලබන රටක ඔබ ඉපදී ඇත්නම් ඔබට සුදුසුකම් ලබාගත හැකි වෙනත් මගක් ඇත්දැයි දැන ගැනීමට නිති අසන පැන සමාලෝචනය කරන්න.

7. **අයදුම්පතේ ඡායාරූප:** ඔබේ,ඔබේ කලත්‍රයාගේ හා අයදුම්පතේ ලැයිස්තු ගත කර ඇති සියලු දරුවන්ගේ, මෑතදී ගත් ඡායාරූප ඇතුළත් කළ යුතුය. සංයෝජන හා තාක්ෂණික පිරිවිතර සඳහා ඩිජිටල් ඡායාරූපයක් ඉදිරිපත්කිරීම බලන්න. දැනටමත් එක්සත් ජනපදයේ පුරවැසියෙක් හෝ නීත්‍යනුකූල ස්ථිර නේවාසිකයෙකුවන කලත්‍රයෙකුගේ හෝ දරුවෙකුගේ ඡායාරූප ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ. එසේ කළත් එය වරදක් සේ නොසැළකේ.

   සමූහ හෝ පවුල් ඡායාරූප පිළිගනු නොලැබේ. සෑම කෙනෙක්ම සඳහා වෙන වෙනම ඡායාරූප ඉදිරිපත් කළ යුතුය. ඡායාරූප මෑතකදී ගත් ඒවා නොවීම හෝ සංස්කරණය කළ ඒවා වීම හෝ පහත විස්තර කර ඇති පිරිවිතර සපුරා නොතිබීම හෝ අයදුම්පත් නුසුදුසුවීමට හා වීසා ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. වැඩි විස්තර සඳහා ඩිජිටල් ඡායාරූපයක් ඉදිරිපත් කිරීම බලන්න.

8. **තැපැල් ලිපිනය :** බාරේ,
   ලිපිනය පේළිය 1,
   ලිපිනය පේළිය 2,
   මහනගරය/ නගරය,
   දිස්ත්‍රික්කය/ පළාත/ ජනපදය/
   තැපැල් කේතය/ සිප් කේතය
   රට.

9. ඔබ අද ජීවත්වන රට
10. දුරකථන අංකය (කැමතිනම්)

11. **ඉ-තැපැල් ලිපිනය :** ඔබට කෙලින්ම ප්‍රවේශ විය හැකි ඉ-තැපැල් ලිපිනයක් ලබාදෙන්න. ඔබේ අයදුම්පත තේරුණහොත් හා ප්‍රවේශ තත්ව පරීක්ෂාව *(Entrant Status Check)* තුලින් ඔබේ තේරීම ගැන ප්‍රතිචාර දැක්වුවහොත් ඔබේ සංක්‍රමණික වීසා සම්මුඛ පරීක්ෂණය පිළිබඳ තොරතුරු ප්‍රවේශ තත්ව පරීක්ෂාවේ ඇති බව දන්වන ඉ-තැපැල් පණිවුඩයක් රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් ඔබට ලැබෙනු ඇත. ඔබ DV වැඩසටහනට තෝරාගත් බව දන්වන ඉ-තැපල් පණිවුඩයක් රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් කිසිදා එවනු නොලැබේ. තෝරාගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ වැඩි විස්තර සඳහා නිති අසන පැන බලන්න.

12. **අද වන විට ඔබ ලබා ඇති ඉහළම අධ්‍යාපන මට්ටම:** (1). ප්‍රාථමික පාසල පමණයි (2). උසස් පාසල. ඩිප්ලෝමාවක් නැත. (3). උසස් පාඨශාලා ඩිප්ලෝමාව. (4). වෘත්තීය පාසල. (5). ඇතැම් විශ්ව විද්‍යාල පාඨමාලා. (6). විශ්ව විද්‍යාල උපාධිය. (7). පශ්චාත් උපාධි මට්ටමේ පාඨමාලා (8). ශාස්ත්‍රපති උපාධිය. (9). ආචාර්ය උපාධි මට්ටමේ සමහර පාඨමාලා සහ (10) ආචාර්ය උපාධිය. අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳ වැඩි විස්තර සඳහා නිති අසන පැන බලන්න.

13. **වර්තමාන විවාහක අවිවාහක තත්වය :** අවිවාහක, විවාහක, දික්කසාද, වැන්දඹු, හෝ නීතියෙන් වෙන් වූ කෙනෙක්ද යන බව. ඔබේ කලත්‍රයාගේ නම, උපන් දිනය, ස්ත්‍රී පුරුෂ භාවය, උපන් මහ නගරය/නගරය, උපන් රට හා ඔබේ ඡායාරූපයේ තාක්ෂණික පිරිවිතරට සමාන ආකාරයේ ඡායාරූපයක් ඇතුළත් කළ යුතුය.

ඔබගේ කලත්‍රයා පිළිබඳ විස්තර ඇතුලත් නොකිරීම ප්‍රධාන අයදුම්කරු නුසුදුස්සෙකු වීමට හේතු වනු පමණක් නොව වීසා සම්මුඛ පරීක්ෂණයේදී සියලුම වීසා ප්‍රතික්ෂේප වීමට ද හේතු වේ. ඔබ වීසා අයදුම්කිරීමට පෙර දික්කසාද වීමට සැලසුම් කලත්, ඔබේ කලත්‍රයා මෙහි ලැයිස්තු ගත කළ යුතුය. දැනටමත් එක්සත් ජනපදයේ පුරවැසියෙක් හෝ නීත්‍යානුකූල ස්ථිර නේවාසිකයෙකු වන කලත්‍රයෙකුට DV වීසා අවශ්‍ය නොවන අතර එවැන්නක් නිකුත් නොකරනු ඇත. ඔබේ අයදුම්පතේ ඔවුන් ලැයිස්තු ගත කළත් එය වරදක් සේ නොසැලකේ. පවුල් සාමාජිකයන් පිළිබඳ වැඩි විස්තර සඳහා නිති අසන පැන බලන්න.

14. **දරුවන් ගණන :** ඔවුන් ඔබ සමග ජීවත් වන්නේද නැත්ද යන්න හෝ ඔබ එක්සත් ජනපදයට සංක්‍රමණය වුවහොත් ඔවුන් සමඟ එන්නේද නැතහොත් පසුව පැමිණෙන්නේද යනාදිය ගැන නොසලකා ඔබේ අයදුම්පතේ, වයස 21ට අඩු සියළුම අවිවාහක ළමයින්ගේ නම, උපන් දිනය, ස්ත්‍රී පුරුෂ භාවය, උපන් මහ නගරය/ නගරය, උපන් රට, ආදි තොරතුරු ලැයිස්තු ගත කළ යුතුය. ඔබේ ඡායාරූපයට යෙදාගත් තාක්ෂණික පිරිවිතරට අනුව සෑම දරුවෙකුගේම ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

පහත සඳහන් තොරතුරු ඇතුළත් කිරීමට වග බලා ගන්න.

- සියලුම ජීවත්වන ස්වාභාවික දරුවන්
- ඔබ නීත්‍යානුකූලව හදා වඩාගත් සියලුම ජීවත්වන දරුවන් හා
- දරුවාගේ දෙමව්පියන් සමග ඔබ තවදුරටත් නීත්‍යානුකූලව විවාහක නොවුවත්, ඔබේ දරුවන් දැනට ඔබ සමග ජීවත්ව නොසිටියත්/ ඔවුන් ඔබ සමග සංක්‍රමණය නොවූවත් ඔබ ඉලෙක්ට්‍රොනික අයදුම්පත ඉදිරිපත් කරන දිනයේ වයස 21ට අඩු සියලුම අවිවාහක සුළු දරුවන්

විවාහක දරුවන් හා වයස අවුරුදු 21 හෝ ඊට වැඩි දරුවන් විවිධත්ව වීසා සඳහා සුදුසුකම් නොලබන බව සලකන්න. කෙසේ වෙතත් සමහර අවස්ථාවන්හිදී වයස් සීමාව ආසන්නයේ සිටින දරුවන්ට එක්සත් ජනපද නීතියේ ඊක්ෂවරණය ලැබේ. ඔබේ අවිවාහක දරුවෙක් වයස 21 වීමට පෙර ඔබ ඉලෙක්ට්‍රොනික අයදුම්පත ඉදිරිපත් කර, වීසා නිකුත් කරන අවස්ථාවේදී දරුවා වයස 21 ඉක්මවා සිටිය හොත් ළමා තත්ව ආරක්ෂණ පනත යටතේ වීසා කටයුතු සඳහා ඔහු/ ඇය වයස 21 කට අඩු ලෙස සලකනු ඇත.

දැනටමත් එක්සත් ජනපද පුරවැසියෙක් හෝ නීත්‍යානුකූල ස්ථිර නේවාසිකයන් වන දරුවන් විවිධත්ව වීසා සඳහා සුදුසුකම් නොලබන අතර එවැනි පවුල් සාමාජිකයන් ඇතුළත් කිරීම හෝ නොකිරීම නිසා ඔබේ අයදුම්පතට හානියක් සිදු නොවේ.

සුදුසුකම් ඇති සියලු දරුවන් ලැයිස්තුවට ඇතුළත් කිරීමට අසමත් වීම, ප්‍රධාන අයදුම්කරු නුසුදුසු වීමට හේතුවන අතරම, වීසා සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී සියලු වීසා ප්‍රතික්ෂේප වීමට ද හේතු වේ. පවුල් සාමාජිකයන් පිළිබඳ වැඩි විස්තර සඳහා නිති අසන පැන බලන්න.

DV-2015 වැඩසටහන සඳහා ඔබේ ඉලෙක්ට්‍රොනික අයදුම්පත සම්පූර්ණ කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා නිති අසන පැන බලන්න.

**අයදුම්කරුවන් තෝරා ගැනීම**

ඒ ඒ කලාප හා රටවලට ලබාදිය හැකි වීසා ප්‍රමාණය මත පදනම්ව සියලුම සුදුසුකම් ලැබූ අයදුම්පත් අතුරින් පරිගණකය අහඹු ලෙස පුද්ගලයන් තෝරා ගනු ඇත. DV වැඩසටහන යටතේ තමන් තේරී ඇත්ද, නැද්ද යන්න ගැන දැන ගැනීමට සියලුම විවිධත්ව වීසා (DV-2015) අයදුම්කරුවන් DV-2015 සබැඳි ලියාපදිංචියේදී ලැබුණු අනුපම තහවුරු අංකය යොදා ගනිමින් E-DV වෙබ් අඩවියේ (*Entrant Status Check*) ප්‍රවේශ තත්ව පරීක්ෂාවට යා යුතුය. 2014 මැයි 01 වැනිදා සිට අඩුම වශයෙන් 2015 ජුනි 30 දක්වා E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ප්‍රවේශ තත්ව පරීක්ෂාව (*Entrant Status Check*) ක්‍රියාත්මක වේ.

ඔබේ අයදුම්පත තෝරා ගත හොත් එක්සත් ජනපදයට සංක්‍රමණය වීම හා සම්බන්ධ ගාස්තු ඇතුළු වැඩිදුර උපදෙස් ලබා දෙන තහවුරු පිටුවකට යොමු කෙරෙනු ඇත. DV-2015 සඳහා තේරුණු අයට ඒ බව දැනුම් දෙන එකම ක්‍රමය (*Entrant Status Check*) ප්‍රවේශ තත්ව පරීක්ෂාව වේ. රාජ්‍ය දෙපාර්තමේන්තුව ඒ බව දැනුම් දෙන ලිපි හෝ ඉ-තැපැල් පණිවුඩ එවන්නේ නැත. එක්සත් ජනපද තානාපති කාර්යාල හෝ කොන්සියුලර් කාර්යාලවලින් තෝරා ගත් අයගේ ලැයිස්තුවක් ලබා නොදේ. තෝරා නොගත් පුද්ගලයන්ටද ඒ බව දැනුම් දෙන්නේ (*Entrant Status Check*) ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුළින් පමණි. (*Entrant Status Check*) ප්‍රවේශ තත්ව පරීක්ෂාවට ඔබම ප්‍රවේශ වන ලෙස තදින්ම උනන්දු කරවන අතර වෙනත් කෙනෙක් එය පරීක්ෂා කර ඔබට දැනුම් දීම මත විශ්වාසය නොතබන්න.

ඔබ තෝරා ගනු ලැබුවහොත් එක්සත් ජනපදයට සංක්‍රමණය වීම සඳහා විවිධත්ව වීසා ලැබීමට, එක්සත් ජනපද නීතිය යටතේ සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සියල්ල සපුරා ලිය යුතුය. ත්‍රස්තවාදයට අනුග්‍රහ දක්වන රාජ්‍යයන් ලෙස හඳුනාගෙන ඇති රටවල් ඇතුලු සමහර රටවල වැසියන් සම්බන්ධයෙන් මෙම අවශ්‍යතාවයන් සපුරාලීමට පැවැත්විය යුතු පරීක්ෂා මට්ටම මෙන්ම වීසා සකස් කිරීමට ගතවන කාලයද සැලකිය යුතු අන්දමින් වැඩි විය හැක.

අයදුම්පත් සැකසීමේ කටයුතු සහ සාර්ථක අයදුම්කරුවන් හා ඔවුන්ගේ සුදුසුකම් ලත් පවුල් සාමාජිකයන්ට විවිධත්ව වීසා නිකුත් කිරීම 2015 සැප්තැම්බර් 30 වන දින මධ්‍යම රාත්‍රියට පෙර අවසන් විය යුතුය. කිසිම හේතුවක් නිසාවත් මෙම දිනයට පසුව විවිධත්ව වීසා නිකුත් කිරීමක් හෝ වෙනස් කිරීමක් අනුමත

නොකරන අතර ප්‍රධාන අයදුම්කරු හා එක්වීමට පවුලේ සාමාජිකයන්ට විවිධත්ව වීසා ලබාගැනීමටද මෙම දිනයට පසු හැකි නොවේ. තෝරා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ වැඩි විස්තර සඳහා නිති අසන පැන බලන්න.

### ඩිජිටල් ඡායාරූපයක් (ප්‍රතිබිම්බයක්) ඉදිරිපත් කිරීම

පහත සඳහන් සංයෝජන හා තාක්ෂණික පිරිවිතරට අනුකූල වන ආකාරයට අලුතින් ඩිජිටල් ඡායාරූපයක් ගැනීමට හෝ මුද්‍රිත ඡායාරූපයක් ස්කෑන් කිරීමට පුළුවන. පිළිගත හැකි හා පිළිගත නොහැකි ඡායාරූපවල නිදර්ශන සහිතව ඡායාරූප සංයෝජනය පිළිබඳ අතිරේක තාක්ෂණික උපදෙස්ද සපයන E-DV වෙබ් අඩවියේ ඇති ඡායාරූප සප්‍රමාණතා සන්ධානය (validation link) තුළින් තමන්ගේ ඡායාරූප වල යෝග්‍යතාවය පරීක්ෂාකල හැකිය.

ඡායාරූප බිටු-24 වර්ණ ගැඹුරක් තිබිය යුතු වේ. ඔබ ස්කෑනරයක් භාවිතා කරන්නේ නම්, සිටුවම සත්‍ය වර්ණ හෝ බිටු-24 වර්ණ පත්‍රාරයට විය යුතුය. ස්කෑන් කිරීමේ අමතර අවශ්‍යතා සඳහා පහත කොටස බලන්න.

### සංයෝජන පිරිවිතර:

#### හිස තිබිය යුතු ආකාරය

- ඡායාරූප ගත කරනු ලබන පුද්ගලයා කැමරාවට ඍජුව මුහුණ දිය යුතුය.
- පුද්ගලයාගේ හිස ඉහලට, පහළට හෝ පැත්තකට හැරී නොතිබිය යුතුය.
- හිසේ උස හෝ මුහුණු ප්‍රදේශයේ ප්‍රමාණය (හිසකෙස්ද ඇතුලුව හිස මුදුනේ සිට නිකටේ පහල කෙළවර දක්වා මැනගත්) සම්පූර්ණ ප්‍රතිබිම්බ උසින් සියයට 50ත් සියයට 69 අතර විය යුතුය. ඇසේ උස (ප්‍රතිබිම්බයේ පතුලේ සිට ඇස්වල මට්ටම දක්වා මැනගත්) ප්‍රතිබිම්බ උසෙන් සියයට 56ත් සියයට 69ත් අතර විය යුතුය.

- **ඩිජිටල් අනුරූ හිසේ ප්‍රමාණ අච්චුව**





Photo Requirement වෙබ් පිටුවේ ඇති නිදර්ශන පරීක්ෂා කරන්න.

- **ලා-පැහැති පසුබිම**
  - ඡායාරූප ගතකරනු ලබන පුද්ගලයා මධ්‍යස්ථ ලා පැහැති පසුබිමක් ඉදිරියේ සිට ඡායරූපය ගත යුතුය.

- **නාභිගත කිරීම**
  - ඡායාරූපය හොඳින් නාභිගත වී තිබිය යුතුය

- **අලංකාර කරන අයිතම**
    - ඡායාරූප ගත කරනු ලබන පුද්ගලයාගේ මුහුණේ පෙනුම වෙනතකට යොමු කරන, අව් කන්නාඩි හෝ වෙනත් අයිතම පැළඳ නොසිටිය යුතුය.

- **හිස්වැසුම් හා තොප්පි**
    - ආගමික විශ්වාසයන්ට අදාළ හිස්වැසුම් හෝ තොප්පි වලට අවසර ඇති නමුත් එවැනි අවස්ථාවන්හිදී වුවද හිස්වැස්මෙන් මුහුණේ කොටසක් වැසී නොතිබිය යුතුය. ගෝත්‍රික හෝ විශේෂිත වශයෙන් ආගමික ස්වභාවයේ නොවන ශීර්ෂාවරණ පැළඳ නොසිටිය යුතුය.. තොප්පි පැළඳ සිටින යුද හමුදා, ගුවන් සේවා සාමාජිකයන්ගේ හෝ එවැනි අතිකුත් පුද්ගලයන්ගේ ඡායාරූපද පිළිගනු නොලැබේ.

**තාක්ෂණික පිරිවිතර**

- **අලුත් ඩිජිටල් පත්‍රිබිම්බයක් ලබා ගැනීම:** අලුත් ඩිජිටල් ප්‍රතිබිම්බයක් ගන්නේ නම් එය පහත සඳහන් පිරිවිතරට අනුව විය යුතුය.
    - ප්‍රතිබිම්බ ගොනුවෙහි හැඩතලය : ප්‍රතිබිම්බය ඒකාබද්ධ ඡායාරූපීය විශේෂඥ කණ්ඩායමේ (JPEG) හැඩතලය අනුව විය යුතුය.
    - ප්‍රතිබිම්බ ගොනුවෙහි ප්‍රමාණය : ප්‍රතිබිම්බ ගොනුවෙහි උපරිම ප්‍රමාණය කිලෝ බයිට් 240 විය යුතුය (240 KB)
    - ප්‍රතිබිම්බ විභේදනය සහ මාන : පිළිගත හැකි අවම මාන වන්නේ පික්සල 600 (පළල) X පික්සල් 600 (උස) වේ. ප්‍රතිබිම්බ පික්සල මාන හතරැස් දර්ශානුපාතයක් විය යුතුය (උස පළලට සමාන විය යුතුය)
    - ප්‍රතිබිම්බ වර්ණ ගැඹුර : ප්‍රතිබිම්බය වර්ණයෙන් විය යුතුය (පික්සලයට බිටු -24) බිටු - 24 කළු සුදු, හෝ බිටු-8 පත්‍රිබිම්බ පිළි නොගැනේ.

- **ඉදිරිපත් කළ ඡායාරූපයක් ස්කෑන් කිරීම :** මුද්‍රිත ඡායාරූපයක් ස්කෑන් කිරීමට පෙර, එය ඉහත දැක්වූ සංයෝජන පිරිවිතරට අනුකූල බවට සහතික වන්න. මුද්‍රිත ඡායාරූපය මුද්‍රණ පහත සඳහන් පිරිවිතරට අනුව ස්කෑන් කරන්න.

    - ස්කෑනර් විභේදනය : අඩුම වශයෙන් අඟලකට තිත් (dpi) 300 විභේදනයට ස්කෑන් කළයුතුය.

    - ප්‍රතිබිම්බ ගොනු හැඩතලය : ප්‍රතිබිම්බ, ඒකාබද්ධ ඡායාරූපීය විශේෂඥ කණ්ඩායමේ : (JPEG) හැඩතලය අනුව විය යුතුය.

    - ප්‍රතිබිම්බ ගොනුවේ ප්‍රමාණය : ප්‍රතිබිම්බ ගොනුවේ පමාණය උපරිම වශයෙන් කිලෝ බයිට් 240 (240 KB) විය යුතුය.
    - ප්‍රතිබිම්බ විභේදනය : පික්සල් 600x600

    - ප්‍රතිබිම්බ වර්ණ ගැඹුර : බිටු 24 වර්ණ. (කළුසුදු, ඒක වර්ණ හෝ අළුවන් ප්‍රතිබිම්බ භාර නොගන්නා බව සලකන්න)

## නිති අසන පැන

### සුදුසුකම

**1. "ස්වදේශිකයා"සහ "අදාළත්වය" යන පදවල තේරුම කුමක්ද ?**

"ස්වදේශිකයා" යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් කෙරෙන්නේ පුද්ගලයා දැනට පදිංචි වී සිටින හෝ ජාතිකත්වය ලබා සිටින රට ගැන නො සලකා, ඔහු උපන් රටයි. සංක්‍රමණික කටයුතු සඳහා ස්වදේශිකයා යන්නෙන්, සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ 202 (ආ) වගන්තියෙහි විධිවිධාන යටතේ ඔහු/ඇය උපන් රට හැර, වෙනත් රටක්, අදාළ රට ලෙස සැලකිය හැකිය.

රටකින් හෝ භූගෝලීය කලාපයකින් ඇතුල්වන සංක්‍රමණිකයන් සඳහා සංඛ්‍යාත්මක සීමාවක් ඇති බැවින් සෑම පුද්ගලයෙක්ම යම් රටකට අයත් ලෙස ගණන් ගැනේ. ඔබේ අදාළත්වයෙන් අදහස් කෙරෙන්නේ ඔබ ගණන් ගැනෙන සීමාවන් සහිත රටයි.

**2. මම සුදුසුකම් ලබන රටක ඉපදී නැති වුවත් මට අයැදුම් කළ හැකිද?**

ඔබට අයදුම් කිරීමට සුදුසුකම් ලබා ගත හැකි අවස්ථා දෙකක් තිබේ. පළමුව ඔබේ කලත්‍රයා සුදුසුකම් ලබන රටක ඉපදී ඇත්නම් ඔබේ කලත්‍රයා උපන් රටට ඔබේ අදාළත්වය ඉල්ලා සිටීමට පුළුවන. ඔබේ සුදුසුකමට පදනම් වී ඇත්තේ ඔබේ කලත්‍රයා බැවින් ඔබට DV-1 වීසාවක් නිකුත් කරනු ඇත්තේ ඔබේ කලත්‍රයාට DV-2 වීසාවක් සඳහා සුදුසුකම් ඇත්නම් පමණි. ඔබේ DV වීසා භාවිතා කරමින් ඔබ දෙදෙනාම එක විට එක්සත් ජනපදයට ඇතුල් විය යුතුය. මේ ආකාරයටම ඔබේ බාල වයස්කාර යැපෙන දරුවන්ටද තම දෙමව්පියන්ගේ උපන් රට, තමාට අදාළ රට ලෙස ගත හැකිය.

දෙවනුව ඔබේ දෙමව්පියන්ගෙන් එක් අයෙක් උපන් රට, ඔබට අදාළ රට ලෙස සැලකිය හැකි වේ. මෙසේ කළ හැක්කේ ඔබේ දෙමව්පියන්ගෙන් එක් අයෙකුවත් ඔබ උපන් රටේ ඉපදී නැත්නම් හා ඔබ උපදින අවස්ථාවේ එම රටේ වාසය නොකලේනම් පමණකි. සාමාන්‍යයෙන් යමෙක් කිසියම් රටක ඉපදී හෝ නීත්‍යානුකූල රටවැසි භාවය ලබා නොගෙන තාවකාලිකව එම රටට පැමිණ සංචාරය කිරීම, අධ්‍යාපන කටයුතු, ආදියේ නිරත වන්නේ නම් හෝ රජයේ හෝ සමාගමක කටයුතු සඳහා එහි නතර වී සිටින්නේ නම් ඔවුන් එම රටේ පදිංචිකරුවන් ලෙස නො සැළකේ.

ඔබ විකල්ප වශයෙන් අදාල රටක් ඉල්ලා සිටින්නේ නම් එම තොරතුරු ඉලෙක්ට්‍රොනික සබැඳි (E-DV) අයදුම්පතේ 6 වැනි ප්‍රශ්නය යටතේ ඉදිරිපත් කළ යුතුය.

සුදුසුකම් ලබන රට හෝ අදාළ රට ලෙස වැරදි රටක් නම් කිරීම (ඔබට තහවුරු කළ නොහැකි) ඔබේ අයදුම්පත නුසුදුසු වීමට හේතු විය හැකිය.

**3. විවිධත්ව වැඩසටහන සඳහා සමහර රටවල ස්වදේශිකයන් සුදුසුකම් නොලබන්නේ කුමක් නිසාද?**

විවිධත්ව වීසා වැඩසටහනේ අරමුණ වන්නේ එක්සත් ජනපදයට සංකමුණිකයන් විශාල සංඛ්‍යාවක් එවන රටවල් හැර වෙනත් රටවල වැසියන් සඳහා සංකමුණික අවස්ථා සපයා දීමයි. "අධි ඇතුළත් වීම් සහිත රටවල්" ලෙස නිතියෙන් අර්ථ දක්වා ඇත්තේ පසුගිය වර්ෂ පහක කාල පරිච්ඡේදය තුළදී පවුල් අනුග්‍රහ ලැබූ සහ රැකියා පදනම් වීසා වර්ග යටතේ එක්සත් ජනපදයට පුද්ගලයන් 50,000 ක් සංක්‍රමණය වූ රටවල් ලෙසය. සෑම වර්ෂයකම වාර්ෂික විවිධත්ව ලොතරැයියට සුදුසුකම් නොලබන රටවල් හඳුනාගැනීම සඳහා එක්සත් ජනපද පුරවැසි සහ සංක්‍රමණ සේවා ආයතනය (USCIS ආයතනය) පවුල් හා රැකියා සංක්‍රමණික සංඛ්‍යා පසුගිය වර්ෂ 05 සංඛ්‍යාවලට එකතු කරයි. සෑම වාර්ෂික

විවිධත්ව වීසා කාල පරිච්ඡේදයකට පෙර අලුත් නිර්ණයක් කෙරෙන බැවින් සුදුසුකම් නොලබන වැසියන් සිටින රටවල ලැයිස්තුව වර්ෂයෙන් වර්ෂයට වෙනස් වීමට ඉඩ තිබේ.

### 4. සෑම කලාපයකම හා සුදුසුකම් ඇති රටක ස්වදේශිකයන්ට ලැබෙන DV-2015 වීසා ගණන කොපමණද?

සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ (INA) 203 (ඇ) වගන්තියෙහි නියම කරන ලද සූත්‍රයට අනුව එක්සත් ජනපද පුරවැසි හා සංක්‍රමණ සේවාව (USCIS) එක් එක් වර්ෂය සඳහා කලාපීය වීසා සීමා නියම කරයි. USCIS ආයතනය මෙම ගණනය කිරීම් අවසන් කළවිට කලාපීය වීසා සීමා ප්‍රකාශයට පත් කරනු ලැබේ. අවසාන වශයෙන් ඒ ඒ රටවල ස්වදේශිකයන්ට නිකුත් කරන වීසා සංඛ්‍යාව තීරණය වන්නේ නියම කරන ලද කලාපීය සීමා, ඒ රටවලින් ඉල්ලුම් කරන සංඛ්‍යාව හා තෝරාගත් අයදුම්කරුවන්ගෙන් වීසා සඳහා සුදුසුකම් ලබන ගණන ආදිය අනුව වේ. කිසිම රටක ස්වදේශිකයන්ට සම්පූර්ණ වීසා ප්‍රමාණයෙන් සියයට හතකට වඩා නොලැබේ.

### 5. අධ්‍යාපනය හෝ වැඩ පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා මොනවාද?

එක්සත් ජනපද සංක්‍රමණ නීතිය හා රෙගුලාසිවලට අනුව සෑම අයදුම්කරුවෙකුටම යටත් පිරිසෙයින් උසස් පාඨශාලා අධ්‍යාපනයක් හෝ එයට සමාන අධ්‍යාපනයක් තිබිය යුතු ය. නැතහොත් පසුගිය වර්ෂ පහ තුළ යටත් පිරිසෙයින් වර්ෂ දෙකක පුහුණුවක් හෝ පළපුරුද්දක් අවශ්‍ය කරන වෘත්තියක වර්ෂ දෙකක වැඩ පළපුරුද්දක් තිබිය යුතු ය. "උසස් පාඨශාලා අධ්‍යාපනය හෝ ඊට සමාන වූවක්" යන්න අර්ථ නිරූපණය කරන්නේ එක්සත් ජනපදයේ අවුරුදු 12ක මූලික හා ද්විතීයික අධ්‍යාපන පාඨමාලාවක් සම්පූර්ණ කිරීම හෝ උසස් පාඨශාලා අධ්‍යාපනයට සමාන වන මූලික හා ද්විතීයික අධ්‍යාපනය පිළිබඳ විධිමත් පාඨමාලාවක් වෙනත් රටකදී සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම යනුවෙනි. මෙම අවශ්‍යතා සපුරන්නේ විධිමත් අධ්‍යයන පාඨමාලා පමණි. තැපැල් පාඨමාලා හෝ සමානතා සහතික (පොදු සමානතා ඩිප්ලෝමා, G.E.D වැනි) පිළි නොගැනේ. වීසා සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන අවස්ථාවෙහි කොන්සියුලර් නිළධාරියාට අධ්‍යාපනය හෝ වැඩ පළපුරුද්ද පිළිබඳව ලියකියවිලි මගින් තහවුරු කොට පෙන්විය යුතුය.

### 6. විවිධත්ව වීසා වැඩසටහන සඳහා සුදුසුකම් ලබන රැකියා මොනවාද?

වැඩ පළපුරුද්ද මත සුදුසු බව තීරණය කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ O*netOnLine (DOL) දත්ත සමුදාය යොදා ගනු ලැබේ. කම්කරු දෙපාර්තමේන්තුවේ O*Net Online database වැඩ පළපුරුද්ද "රැකියා කලාප" පහකට වර්ග කරයි. DOL වෙබ් අඩවියෙහි බොහෝ රැකියා ලැයිස්තු ගත කර ඇතත් විවිධත්ව වීසා වැඩසටහන සඳහා සමහර රැකියා සුදුසුකම් නොලබයි. ඔබගේ වැඩ පළපුරුද්ද පදනම මත විවිධත්ව වීසාවක් සඳහා සුදුසුකම් ලැබීමට පසුගිය අවුරුදු පහක් තුළදී විශේෂිත වෘත්තීය සූදානම් වීම් (SVP) පරාසයෙහි 7.0 හෝ ඊට ඉහළින් වර්ග කරන ලද රැකියා කලාප 4 හෝ 5 යනුවෙන් නම් කරන ලද රැකියාවක වර්ෂ දෙකක පළපුරුද්දක් තිබිය යුතු වේ.

### 7. කම්කරු දෙපාර්තමේන්තුවේ O*Net Online database හි සුදුසුකම් ලබන විවිධත්ව වීසා රැකියාවක් මා සොයා ගන්නේ කෙසේද?

O*net Online වෙබ් අඩවියට ප්‍රවේශ වීමෙන් පසුව ඔබගේ රැකියාව, සුදුසුකම් ලබන්නක් දැයි සොයා බැලීමට මෙම පියවර අනුගමනය කරන්න.

1. "රැකියා සොයන්න" (Find Occupations) යටතේ ඇති පහතට වැටෙන මෙනුවෙන් "රැකියා පවුල"(Job Family) තෝරා ගන්න.

2. "රැකියා පවුල"(Job Family) යටතේ උඩමතු බලා ඔබේ තේරීම කර "යන්න"(GO) ක්ලික් කරන්න.
3. ඔබේ විශේෂිත රැකියාව සඳහා ඇති සබැඳිය මත ක්ලික් කරන්න.
4. රැකියා කලාප අංකය හා විශේෂිත වෘත්තීය සුදානම්වීම් (SVP) පරාසයේ අගය සොයා ගැනීම සඳහා "රැකියා කලාප" (Job Zone) ටැබය තෝරාගන්න.

උදාහරණ වශයෙන් ගගනික ඉන්ජිනේරුවන් තෝරන්න. ගගනික ඉන්ජිනේරුවන් සඳහාවූ සාරාංශ වාර්තාවේ පහළ කොටසේ රැකියා කලාප කොටස යටතේ ඔබට රැකියා කලාප 4, SVP පරාසය 7 සිට < 8.0 දක්නට ලැබෙනු ඇත. මෙම උදාහරණයට අනුව ගගනක ඉන්ජිනේරු කටයුතු සුදුසුකම් ලබන රැකියාවක් වේ.

වැඩිදුර තොරතුරු සඳහා Diversity Visa - List of Occupations වෙබ් පිටුවට පිවිසෙන්න.

**8. E-DV වැඩසටහන සඳහා අයදුම් කිරීමට අයදුම්කරුවන් සඳහා අවම වයසක් තිබේද?**

වැඩ සටහන සඳහා අයැදුම්කිරීමට අවම වයසක් නැත. අයැදුම් කරන අවස්ථාවේදී ප්‍රධාන අයැදුම්කරුට උසස් පාඨශාලා අධ්‍යාපනයක් හෝ වැඩ පළපුරුද්දක් අවශ්‍යවීම නිසා, වයස අවුරුදු 18 අඩු බොහෝ පුද්ගලයන් නුසුදුසු වීමට හේතු වේ.

## විවිධත්ව වීසා (DV) වැඩසටහන සඳහා ඔබේ ඉලෙක්ට්‍රොනික අයදුම්පත සම්පූර්ණ කිරීම

**9. මගේ අයදුම්පත ඉදිරිපත් කළ හැක්කේ කවදාද?**

DV-2015 අයැදුම් කාල පරිච්ඡේදය 2013 ඔක්තෝබර් 01 වැනි අඟහරුවාදා නැගෙනහිර දිවාකාල මධ්‍යාහ්නයේ (EDT) (GMT -4) සිට 2013 නොවැම්බර් 02 වැනි සෙනසුරාදා නැගෙනහිර දිවාකාල වේලාවෙන් මධ්‍යාහ්නය (EDT) (GMT-4) දක්වා වේ. සෑම වර්ෂයකදීම ලියාපදිංචිකිරීම් කාල පරිච්ඡේදය තුළදී මිනිසුන් දස ලක්ෂ ගණනක් මේ වැඩසටහනට අයැදුම් කරති. මෙම අයැදුම් කාල පරිච්ඡේදය පවත්වා ගැනීමෙන් තෝරා ගනු ලැබුවන්ට කාලානුරූප අයුරින් දැන්වීමටත්, වීසා අයදුම්කරුවන්ට හා අපගේ තානාපති කාර්යාලවලට හා දූත මණ්ඩලවලට වීසා සූදානම් කොට සම්පූර්ණ කොට නිකුත් කිරීමට කාලය ලබා දීමත් සහතික කෙරේ.

ලියාපදිංචි කිරීම් කාල පරිච්ඡේදය තුළ දී හැකි තාක් කලින් අයැදුම් කිරීමට ඔබ දිරිගන්වනු ලැබේ. ලියාපදිංචි කාල පරිච්ඡේදයේ අවසාන භාගයේදී ඇති වන අති විශාල ඉල්ලුම නිසා පද්ධතිය මන්දගාමී වීමට ඉඩ තිබේ. 2013 නොවැම්බර් 02 වැනි සෙනසුරාදා (EDT) මධ්‍යාහ්නයෙන් පසුව කිසිදු අයැදුම් පතක් බාරගනු නොලැබේ.

**10. මම දැනට සිටින්නේ එක්සත් ජනපදයේයි. මට DV වැඩසටහනට අයදුම් කළ හැකිද?**

ඔව්. එසේ කළ හැකිය. අයදුම්කරු එක්සත් ජනපදයේ සිටියත් වෙනත් රටක සිටියත්, අයැදුම්පත ඕනෑම තැනකින් ඉදිරිපත් කළ හැකි වේ.

**11. ලියාපදිංචි කාල පරිච්ඡේදයේ දී මට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම් පතක් පමණක්ද ?**

ඔව්. එක් ලියාපදිංචි කිරීම් කාල පරිච්ඡේදයක් තුළ දී නීතියෙන් ඉඩදී ඇත්තේ එක් පුද්ගලයෙක් වෙනුවෙන් එක් අයැදුම්පතකට පමණි. ලියාපදිංචි කාල පරිච්ඡේදයේ දී අයැදුම්පත් කීපයක් ඉදිරිපත් කරන අය හඳුනා ගැනීම සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුව සූක්ෂම තාක්ෂණයක් යොදා ගනී. ඔබ අයැදුම්පත් එකකට වැඩියෙන් ඉදිරිපත් කළහොත් නුසුදුස්සෙක් බවට පත් වනු ඇත.

## 12. මා හා මගේ කලත්‍රයාට වෙනම අයදුම් පත් ඉදිරිපත් කළ හැකිද?

ඔව්. සැමියා සහ බිරිඳ සුදුසුකම් අවශ්‍යතා සපුරා ඇත්නම් එක් අයදුම්පතක් බැගින් ඉදිරිපත් කළ හැකිය. දෙදෙනාගෙන් එක් අයකු තෝරා ගනු ලැබුවහොත් අනික් පුද්ගලයා ව්‍යුත්පන්න යැපෙන්නෙකුගේ තත්ත්වය ලැබීමට සුදුසු වේ.

## 13. මගේ E-DV අයදුම්පතේ ඇතුලත් කළ යුත්තේ පවුලේ කුමන සාමාජිකයින්ද?

**කලත්‍රයා** (එනම් සැමියා හෝ බිරිඳ) ඔබ සමඟ ජීවත් වන්නේද, එක්සත් ජනපදයට සංක්‍රමණය වීමට බලාපොරොත්තුවන්නේද යනාදිය ගැන නොසලකා ලැයිස්තු ගත කළ යුතුය. ඔබ නීතියෙන් වෙන් වී නැත්නම් (උදා: උසාවිය විසින් හෝ උසාවි නියෝගයක් මගින් පිළිගනු ලැබූ ලිඛිත ගිවිසුමක් ඇති) ඔහුගෙන්/ඇයගෙන් ඔබ දැනට වෙන් වී සිටියත් කලත්‍රයාගේ නම ලැයිස්තු ගත කළ යුතුය. ඔබ නීත්‍යානුකූල ව වෙන් වී සිටී නම් ඔබගේ කලත්‍රයාගේ නම ලැයිස්තු ගත කිරීම අවශ්‍ය නැති අතර එසේ කළත් එය වරදක් ලෙස නොසැලකේ. ඔබ දික්කසාද වී ඇත්නම් හෝ ඔබේ කලත්‍රයා මියගොස් ඇත්නම් ඔබේ කලින් කලත්‍රයා ලැයිස්තුගත කිරීම අවශ්‍ය නොවේ.

**ළමයින්:**,ඔබගේ ස්වාභාවික දරුවන්. ඔබේ සුළු දරුවන් ( එම දරුවන්ගේ මාපියන්ගෙන් ඔබ දැන් දික්කසාදවී සිටියත්), ඔබගේ කලත්‍රයාගේ දරුවන් හෝ ඔබගේ රටේ නීතියට අනුව හදා වඩා ගත් දරුවන් ආදී ඔබේ E-DV අයදුම්පත ඉදිරිපත් කරන දිනට අවිවාහක හා වයස අවුරුදු 21 ට අඩු සියලුම දරුවන් ලැයිස්තු ගත කළ යුතුය. ඔබේ දරුවන් තවදුරටත් ඔබ සමඟ වාසය නොකළත් මෙම DV වැඩසටහන යටතේ සංක්‍රමණය වීමට ඔවුන් බලාපොරොත්තු නොවූවත්, ඔබේ ඉලෙක්ට්‍රොනික අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී වයස 21 ට අඩු සියලු දරුවන් අයදුම්පතේ ඇතුළත් කළ යුතුය. දැනටමත් එක්සත් ජනපදයේ පුරවැසියන් හෝ නීත්‍යානුකූල ස්ථිර නේවාසිකයන් වන දරුවන් ලැයිස්තු ගත කළ යුතු නොවන අතර එසේ කළත් එය වරදක් ලෙස නොසැලකේ.

අයදුම්කරුගේ දෙමාපියන් හා සහෝදර සහෝදරියන් යැපෙන්නන් ලෙස DV වීසා ලැබීමට සුදුසුකම් නොලබන අතර ඔබේ අයදුම්පතේ ඔවුන් ඇතුලත් කළ යුතු නොවේ.

ඔබගේ පවුල් සාමාජිකයන් ලැයිස්තු ගත කිරීම නිසා ඔවුන් වීසා ඉල්ලා සිටීම හෝ ඔබ සමග යෑම අවශ්‍ය නොවේ. කෙසේ වුවත් සුදුසුකම් ඇති යැපෙන්නකු මුල් අයදුම්පතේ ඇතුළත් නොකර ඔබගේ වීසා අයදුම්පතෙහි ඇතුළත් කර ඇති කර ඇත්නම්, එය ඔබ නුසුදුස්සෙක් කරන අතර ඔබ කිසිවෙකුට වීසා නොලැබෙනු ඇත. මෙය අදාළ වන්නේ මුල් අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ පවුල් සාමාජිකයන් වූ අයට පමණි. පසුව සම්බන්ධ කර ගත් අයට නොවේ. ඔබගේ අයදුම්පතේ ඔබගේ කලත්රයා ලැයිස්තු ගත කර තිබුණත්, ඔහුට/ඇයට වෙනම අයදුම්පතක් ඉදිරිපත් කළ හැකිය. අයදුම්පත් දෙකේම සියලු යැපෙන්නන්ගේ විස්තර ඇතුළත් විය යුතුය. (ඉහත නිති අසන පැන # 12 බලන්න.)

## 14. මගේ අයදුම්පත මා විසින්ම ඉදිරිපත් කළ යුතුද? නැතහොත් මා වෙනුවෙන් වෙනත් අයකුට එසේ කළ හැකිද?

ඔබේ අයදුම්පත පිළියෙල කර ඉදිරිපත් කිරීමට ඔබ දිරිගන්වන නමුත් ඔබ වෙනුවෙන් වෙනත් අයෙකුටද එය ඉදිරිපත් කිරීමට පුළුවන. පුද්ගලයෙක් කෙළින්ම අයදුම්පත ඉදිරිපත් කළත්, ඒ සඳහා නීතිඥවරයකුගේ, මිතුරකුගේ ඥාතියකුගේ හෝ වෙනත් කෙනෙකු ආධාර ලබාගත්තත් ඔබේ නමින් ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පතෙහි ඇති තොරතුරු සත්‍ය හා සම්පූර්ණ බව සහතික කිරීමේ වගකීම අයදුම්කරු ලෙස ඔබ භාර ගත යුතුය. නිවැරදි නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. නිල DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ප්‍රවේශ තත්ව

පරීක්ෂාව (Entrant Status Check) තමාගේ අයැදුම්පතේ තත්වය ස්වාධීනව බලාගැනීම සඳහා අයදුම්කරුවන්, තහවුරු කිරීමේ පිටුවේ තොරතුරු තමා ළඟ තබා ගත යුතුය.

**15. මම දැනටමත් වෙනත් රටක සංක්‍රමණ වීසාවක් සඳහා ලියා පදිංචි වී ඇත්තෙමි. මට DV වැඩසටහනට අයැදුම් කළ හැකිද?**

කළ හැකියි.

**16. E-DV සබැඳිව ලබාගත හැක්කේ කවදාද?**

DV-2015 ලියාපදිංචිවීමේ කාල පරිච්ඡේදය වන 2013 ඔක්තෝබර් 01 වැනි අඟහරුවාදා නැගෙනහිර දිවාකාල මධ්‍යාහ්නයේ (EDT) (GMT -4) සිට 2013 නොවැම්බර් 02 වැනි සෙනසුරාදා නැගෙනහිර දිවාකාල වේලාවෙන් මධ්‍යාහ්නය (EDT) (GMT-4) දක්වා සබැඳිව E-DV අයදුම්පතට ප්‍රවේශ විය හැකියි.

**17. E-DV අයදුම්පත බාගත කර පද සකසන වැඩසටහනක සුරකීමෙන් පසුව පිරවිය හැකිද?**

නැත. පසුව සම්පූර්ණ කොට ඉදිරිපත් කිරීම සඳහා වෙනත් වැඩසටහනක සුරැකිය නොහැකිය. E-DV අයදුම් පෝරමය, වෙබ් පෝරමයක් පමණි. සබැඳිව තොරතුරු පුරවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

**18. සබැඳි පෝරමය සුරැකුම් කොට පසුව සම්පූර්ණ කළ හැකිද?**

නැත, මෙය කළ නොහැකිය. E-DV අයදුම්පත සැලසුම් කර ඇත්තේ එක් විටකදී සම්පූර්ණ කොට ඉදිරිපත් කිරීම සඳහාය. සබැඳි අයැදුම්පත බාගත කිරීමෙන් , E-DV වෙබ් අඩවියට අයැදුම්පත ලැබෙන අවස්ථාවත් අතර ඔබට මිනිත්තු හැටක (60) කාලයක් ලැබේ. මිනිත්තු හැටකට පසු අයැදුම්පත ඉලෙක්ට්‍රොනිකව නොලැබුණහොත් ඒ වන විටත් ලැබී තිබුණු තොරතුරු ඉවතලනු ලැබේ. පසුව ලැබෙන සම්පූර්ණ අයදුම්පතක්, පෙර ලැබුණු අර්ධ අයදුම්පතක පිටපතක් ලෙස අහම්බෙන් හඳුනාගැනීම වැලැක්වීමට පද්ධතිය අර්ධ තොරතුරු මකා දමයි. සබැඳි පෝරමය සම්පූර්ණ කිරීම ආරම්භ කිරීමට පෙර අවශ්‍ය වන්නේ කුමන තොරතුරදැයි දැන ගැනීමට විවිධත්ව වීසා (DV) උපදෙස් සම්පූර්ණයෙන් කියවන්න.

**19. මට ස්කෑනරයක් නැත්නම් එක්සත් ජනපදයේ සිටින මගේ ඥාතියකුට ඡායාරූප යවා, ඒවා ස්කෑන් කොට, සුරකින ලද ඡායාරූප මාවෙත ගෙන්නා ගෙන ඒවා මගේ අයදුම්පතට භාවිතා කළ හැකිද?**

එසේය. උපදෙස්වල දී ඇති ඡායාරූප අවශ්‍යතා සපුරාලන්නේනම් හා E-DV සබැඳි අයැදුම්පත සමග ඡායාරූපද ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඉදිරිපත් කරන්නේ නම් මෙය කළ හැකිය. සබැඳි අයදුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවේ අයදුම්කරුවන් ළඟ ස්කෑන් කරන ලද ඡායාරූප ගොනුවක් ද තිබිය යුතුය. ඡායාරූපය සහ අයදුම්පත වෙන වෙනම ඉදිරිපත් කළ නොහැක. සම්පූර්ණ අයැදුම්පත (ඡායාරූපය හා අයදුම්පත) එක්සත් ජනපදයෙන් හෝ පිටරටකින් ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කළ හැකිය.

**20. ක්‍රියාපටිපාටියට අනුව ඉදිරිපත් කරන ලද ඩිජිටල් ප්‍රතිබිම්බය පිරිවිතරට අනුකූල නොවන්නේ නම් E-DV අයැදුම්පත ඉබේම පද්ධතිය විසින් ප්‍රතික්ෂේප කෙරෙන බව සඳහන් වේ. මට අයැදුම්පත නැවත ඉදිරිපත් කළහැකිද?**

එසේය, ඔබේ ඡායාරූප පිරිවිතරට අනුකූල නොවූ බැවින් ඔබේ අයදුම්පත E-DV වෙබ් අඩවිය පිළිනොගන්නා බැවින් ඔබට තහවුරු කිරීමේ දැන්වීමක් නොලැබෙනු ඇත. කෙසේ වෙතත් අන්තර්ජාලයේ අවිනිශ්චිත ස්වභාවය නිසා ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම වහාම නොලැබීමට ඉඩ තිබේ. ඔබට ඡායාරූප

නිවැරදිකර හා පෝරමයේ පළමුවැනි හා දෙවැනි කොටස් විනාඩි හැටක් (60) තුළ නැවත එවිය හැකි නම් සාර්ථක ලෙස අයැදුම්පත ඉදිරිපත් කිරීමට හැකිවේ.. එසේ නොවුවහොත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය නැවත පටන් ගත යුතුය. තහවුරු කිරීමේ දැන්වීම ලැබෙන තුරු ඔබට ඕනෑ තරම් වාරයක් අයැදුම්පතක් ඉදිරිපත් කිරීමට උත්සාහ කළ හැකිය. තහවුරු කිරීමේ දැන්වීම ලැබුන විට ඔබේ අයැදුම් ක්‍රියාවලිය සම්පූර්ණ වන අතර අතිරේක අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතුය.

### 21.මගේ අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු එවන ඉලෙක්ට්‍රොනික තහවුරු කිරීමේ දැන්වීම කොතරම් ඉක්මණින් ලැබේද?

ඔබ ළඟ තබාගත යුතු තහවුරු කිරීමේ අංකය ඇතුළු තහවුරු කිරීමේ දැන්වීම වහාම ලැබිය යුතුය. කෙසේ අන්තර් ජාලයේ අවිනිශ්චිත ස්වභාවය නිසා පමාවන් සිදුවීමට ඉඩ තිබේ. සම්පූර්ණ අයැදුම්පත යැවෙන තුරු හා තහවුරු කිරීමේ දැන්වීම ලැබෙන තුරු ඕනෑ තරම් වාරයක් "ඉදිරිපත් කරන්න" (Submit) බොත්තම එබිය හැකිය. කෙසේ වෙතත් ඔබට තහවුරු කිරීමේ දැන්වීම ලැබීමෙන් පසු ඔබේ තොරතුරු නැවත ඉදිරිපත් නොකළ යුතුය.

## තෝරාගැනීම

### 22.මා තේරී ඇද්දැයි දැන ගන්නේ කෙසේද?

2014 මැයි 1වැනිදා සිට අඩු වශයෙන් 2015 සැප්තැම්බර් දක්වා E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ප්‍රවේශ තත්ව පරීක්ෂාවට *(Entrant Status Check)* ප්‍රවේශවීමට ඔබේ තහවුරු කිරීමේ අංකය යොදා ගන්න. ඔබ තේරී ඇත්නම් ඒබව දැනුම් දීම, වීසා අයදුම්පත පිළිබඳව වැඩිදුර විස්තර ලබා දීම, සංක්‍රමණික වීසා සම්මුඛ පරීක්ෂණයේ දිනය හා වේලාව දැනුම් දීම ආදී සියල්ල සිදුවන එකම ක්‍රමය ප්‍රවේශ තත්ව පරීක්ෂාව වෙයි. විවිධත්ව වීසා වැඩසටහනට නිල සබැඳි අයදුම්පත් ඉදිරිපත් කළ හැකි මෙන්ම තත්ව පරීක්ෂාවට ප්‍රවේශ විය හැකි රාජ්‍ය දෙපාර්තමේන්තුවේ බලය ලත් එකම වෙබ් අඩවිය වන්නේ www.dvlottery.state.gov වෙබ් අඩවියයි.

ඔබ තේරී ඇතිබව දැනුම් දීමට රාජ්‍ය දෙපාර්තමේන්තුව ඔබ හා සම්බන්ධ නොවනු ඇත.

### 23.මා තේරී නැත්නම් ඒ බව දැනගත හැක්කේ කෙසේද ? මට ඒ පිළිබඳව දැනුම් දෙනවාද ?

2014 මැයි 1 වැනිදා සිට අඩු වශයෙන් 2015 ජූනි 30 දක්වා E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ප්‍රවේශ තත්ව පරීක්ෂාව *(Entrant Status Check)* තුළින් ඔබේ DV-2015 අයදුම්පතේ තත්වය පරීක්ෂා කිරීමට පුළුවන. අඩුම වශයෙන් 2015 සැප්තැම්බර්30 වැනිදා දක්වා ඔබේ තහවුරු කිරීමේ අංකය තබා ගන්න. (පසුගියවර්ෂයේ එනම් DV-2014 තත්ව තොරතුරු 2013 මැයි 1 සිට 2014 ජූනි30 දක්වා සබැඳිව ලබා ගත හැකිවේ) ඔබේ අයදුම්පත තෝරා නොගතහොත් ඔබට වැඩිදුර උපදෙස් නොලැබෙනු ඇත.

### 24.මගේ තහවුරුකිරීමේ අංකය නැතිවුවහොත් කුමක් වේද?

ප්‍රවේශ තත්ව පරීක්ෂාවට *(Entrant Status Check)* ප්‍රවේශ වීමට ඔබේ තහවුරු කිරීමේ අංකය තිබිය යුතුය. ඔබේ අනන්‍යතාව තහවුරුකිරීමට සමහර පුද්ගලික තොරතුරු ඇතුල් කිරීමෙන් ඔබ ලියාපදිංචිවූ ඉ-තැපල් ලිපිනය හරහා ඔබේ තහවුරුකිරීමේ අංකය නැවත ලබාගත හැකි මෙවලමක් දැන් eDV වෙබ් අඩවියේ ප්‍රවේශ තත්ව පරීක්ෂාවේ *(Entrant Status Check)* තිබේ.

එක්සත් ජනපද තානාපති කාර්යාල, කොන්සියුලර් කාර්යාල හා කෙන්ටකි කොන්සියුලර් මධ්‍යස්ථානයට ඔබ වෙනුවෙන් තෝරා ගැනීමේ තත්වය පරීක්ෂා කිරීමට හෝ කෙළින්ම ඔබේ තහවුරුකිරීමේ අංකය ලබාදීමට (ප්‍රවේශ තත්ව පරීක්ෂාවේ මෙවලම තුළින් හැර) නොහැක. වීසා කටයුතු සඳහා තෝරාගත් අයගේ ලැයිස්තුවක් ලබාදීමටද රාජ්‍ය දෙපාර්තමේන්තුවට හැකියාවක් නැත.

## 25.රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් මට ඉ-තැපෑලෙන් හෝ සාමාන්‍ය තැපෑලෙන් තොරතුරු ලැබේවිද?

රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඔබට දැනුම් දීමේ ලිපි එවනු නොලැබේ එක්සත් ජනපද රජය, තෝරාගනු ලැබූ පුද්ගලයන්ට ඒ බව දන්වා ඉ-තැපැල් පණිවුඩ කිසිදා එවා නැති අතර, DV-2015 වැඩසටහන තුළද එසේ කිරීමට සැලසුමක් නැත. තෝරාගත් අයට ප්‍රවේශ තත්ව පරීක්ෂාවේ *(Entrant Status Check)* ඇති දැනුම් දීමේ උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමෙන් පසුව වීසා සම්මුඛ පරීක්ෂණය පිළිබඳව දැනුම් දෙන ඉ-තැපැල් පණිවුඩයක් ලැබෙනු ඇත. මෙම ඉ-තැපැල් පණිවුඩයේ සම්මුඛ පරීක්ෂණ දිනය හා වේලාව පිළිබඳ තොරතුරු ඇතුළත් නොවන අතර එයින් දන්වන්නේ සම්මුඛ පරීක්ෂණ විස්තර සඳහා ප්‍රවේශ තත්ව පරීක්ෂාව *(Entrant Status Check)* විමසන ලෙසයි.

‘'.gov" වසම ඇතුළත් අන්තර්ජාල අඩවි පමණක් රාජ්‍ය දෙපාර්තමේන්තුවේ එක්සත් ජනපද නිල රාජ්‍ය වෙබ් අඩවි බව සලකන්න. වෙනත් බොහෝ රාජ්‍ය නොවන වෙබ් අඩවි (උදා: ".com" හෝ ".org" හෝ ".net" උපසර්ග යොදා ඇති) සංක්‍රමණ හා වීසා හා සම්බන්ධ තොරතුරු හා සේවා සපයයි. මෙම වෙබ් අඩවිවල අඩංගු කිසිදු තොරතුරක් හෝ කරුණක්, රාජ්‍ය දෙපාර්තමේන්තුව අනුමත කරන්නේ, නිර්දේශ කරන්නේ, හෝ අනුග්‍රහ දක්වන්නේ නැත.

මුදල් හෝ ඔබේ පුද්ගලික තොරතුරු ලබාගැනීමට තැත් කරන මෙවැනි වෙබ් අඩවි වලින් ඔබට ඉ-තැපැල් එවනු ඇත. මෙම වෙබ් අඩවි, රාජ්‍ය දෙපාර්තමේන්තු වීසා සේවා වෙබ් අඩවියෙහි හෝ පිටරටවල තානාපති කාර්යාලවල දූත මණ්ඩල අංශ වෙබ් අඩවිවලින් නොමිලේ ලබාගත හැකි ආකෘතිපත්‍ර හා සංක්‍රමණ කාර්ය පටිපාටි ගැන තොරතුරු ලබා දීම වැනි සේවා සඳහා මුදල් ගෙවන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. මීට අතිරේක වශයෙන් විවිධත්ව වීසා සම්බන්ධ සේවාවන් සඳහා මුදල් අයකරමින් මෙම වෙබ් අඩවි ඔබගෙන් මුදල් සොරකම් කිරීමට තැත් කරනු ඇත. මෙම කූටෝපක්‍රමවලට හසුවී ඔබ මුදල් යැවුවහොත් ඔබට එය කිසිදාක නොලැබීමට ඉඩ තිබේ. තවද, අනන්‍යතා වංචා/සොරකම් සඳහා යොදාගත හැකි කිසිදු පුද්ගලික තොරතුරක් මෙම වෙබ් අඩවිවලට නො යැවිය යුතුය.

## 26. DV-2015 සඳහා පුද්ගලයන් කී දෙනෙකු තෝරා ගනු ලබන්නේද?

DV-2015 සඳහා වීසා 50,000 ක් ලබා ගත හැකිවේ. පළමුවෙන් තෝරා ගනු ලැබූ 50,000 න් එක්තරා කොටසක් වීසා සඳහා සුදුසුකම් නොලබන අතර, තවත් කොටසක් වීසා ලබා ගැනීමට උනන්දු නොවන බැවින්, ලබා ගත හැකි DV වීසා සියල්ල නිකුත් කළ බව සහතික කරනු පිණිස අයැදුම්පත් 50,000 කට වැඩි ප්‍රමාණයක් තෝරා ගනු ඇත. කෙසේ වුවත් මෙයින් අදහස් කෙරෙන්නේ, මූලික වශයෙන් තෝරා ගනු ලැබූ සියලූ දෙනා සඳහා ප්‍රමාණවත් වීසා ගණනක් නොතිබිය හැකි බවයි.

තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්ට තමන් තේරී ඇද්ද යන්න හා ලැයිස්තුවේ තමන්ට ලැබුණු ස්ථානය පිළිබඳ ව E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ප්‍රවේශ තත්ව පරීක්ෂාව *(Entrant Status Check)* තුලින් බලා ගත හැකි වේ. දැන්වීම් උපදෙස් වල ඉල්ලා ඇති පූර්ව-සම්මුඛ පරීක්ෂණ ලිය කියවිලි හා අනිකුත් තොරතුරු සැපයූ අයැදුම්කරුවන් සඳහා DV-2015 සම්මුඛ පරීක්ෂණ 2014 ඔක්තෝබර් මාසයේදී ආරම්භ වේ. තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට, විදේශ රටවල ඇති එක්සත් ජනපද කොන්සියුලර් කාර්යාලවල නිලධාරීන් සමග උපලේඛන ගත කරන ලද සම්මුඛ පරීක්ෂණවලට සති හතරේ සිට හයක කාලයකට පෙර වෙබ් අඩවියේ ප්‍රවේශ තත්ව පරීක්ෂාව තුලින් දැනුම් දෙනු ඇත.

වීසා අංක ලබාදීමේ ඉඩ අනුව සෑම මසකම එම මාසයෙහි වීසා නිකුත් කරනු ලැබීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ට වීසා නිකුත් කෙරේ. DV වීසා 50,000 ම නිකුත් කර අවසන් වූ විට වසර සඳහා වූ වැඩසටහන ද අවසන් වේ. ප්‍රතිපත්තිමය වශයෙන් වීසා අංක 2015 සැප්තැම්බර් මාසයට පෙර අවසන් විය හැකිය. වීසා ලබා ගනු කැමති, තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්, තමන්ගේ කාරණය ගැන වහාම ක්‍රියාත්මක විය යුතුය. **අහඹු තෝරා ගැනීම තුළින් තෝරා ගනු ලැබුවකු වශයෙන් ඔබට ඉබේම වීසාවක් ලැබේ යයි සහතිකයක් නැත. තෝරාගැනීමෙන් අදහස් කරන්නේ ඔබට විවිධත්ව වීසාවක් අයදුම්කිරීමට සුදුසුකම් ඇති බව හා සුදුසුකම් ඇත්නම් වීසාවක් නිකුත් කරන බවයි. වීසා නිකුත් කරනු ලබන්නේ සුදුසුකම් ඇති තෝරා ගත් අයදුම්කරුවන්ගෙන් පළමු 50,000ට පමණි.**

### 27. සාර්ථක අයදුම්කරුවන් තෝරා ගනු ලබන්නේ කෙසේද?

**තෝරා ගැනීම පිළිබඳ නිල දැනුම් දීම කෙරෙන්නේ 2014 මැයි 01 වැනිදා සිට අඩුම වශයෙන් 2015 ජුනි 30 දක්වා E-DV වෙබ් අඩවියෙන් (www.dvlottery.state.gov) ලබාගත හැකි ප්‍රවේශ තත්ව පරීක්ෂාව *(Entrant Status Check)* තුළිනි. රාජ්‍ය දෙපාර්තමේන්තුව, තෝරා ගැනීම පිළිබඳ නිල දැනුම්දීම් ඉ-තැපෑලෙන් හෝ සාමාන්‍ය තැපෑලෙන් යවනු නොලැබේ. ඔබගේ E-DV තෝරා ගනු ලැබීම ගැන දැන්වීමක් ඉ-තැපෑලෙන් හෝ සාමාන්‍ය තැපෑලෙන් ඔබට ලැබුණ හොත්, එය රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් නොවන බවත් එය නීත්‍යානුකූල දැන්වීමක් නොවන බවත් දැන ගන්න. රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් ඔබට ලැබෙන ඉ-තැපැල් පණිවුඩයේ සඳහන් වන්නේ ඔබේ අයදුම්පත පිළිබඳ අළුත් තොරතුරු සඳහා ප්‍රවේශ තත්ව පරීක්ෂාව *(Entrant Status Check)* සමාලෝචනය කරන ලෙසයි. රාජ්‍ය දෙපාර්තමේන්තුව කිසිදාක තැපෑලෙන් හෝ වෙස්ටර්න් යුනියන් වැනි වෙනත් සේවාවක් මගින් මුදල් එවන ලෙස ඔබෙන් ඉල්ලීමක් <u>නොකරනු</u> ඇත.**

එක් එක් ප්‍රදේශයකින් ලැබී ඇති සියලු අයැදුම්පත් වෙන් වෙන් ව අංක කරනු ලැබේ. ලියාපදිංචි කිරීමේ කාල පරිච්ඡේදය අවසානයේදී, එක් එක් භූගෝලීය ප්‍රදේශය සඳහා ලැබී ඇති සියලුම අයැදුම් පත් වලින් පරිගණකයක් අහඹු ලෙස අයැදුම් පත් තෝරා ගනී. ප්‍රදේශය තුළ අහඹු ලෙස තෝරා ගනු ලැබූ පළමුවැනි අයැදුම්පත පළමුවැන්න ලෙසද, තෝරා ගනු ලැබූ දෙවැනි අයැදුම්පත, දෙවැන්න ලෙසද යනාදි වශයෙනි. එක් එක් ප්‍රදේශයක ලියාපදිංචි කිරීමේ කාලය තුල ලැබුණු සියලුම අයදුම්පත් වලට තෝරා ගැනීමේදී සමාන අවස්ථාවක් ලැබෙනු ඇත. අයැදුම්පතක් තෝරාගත් විට, E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) ඇති ප්‍රවේශ තත්ව පරීක්ෂාව *(Entrant Status Check)* තුළින් 2014 මැයි 01 වැනිදා සිට ඒ බව අයැදුම්කරුට දැනුම් දෙනු ලැබේ. එක්සත් ජනපද කොන්සියුලර් කාර්යාලයකදී වීසා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටින ලෙස තෝරා ගනු ලැබූ අනාගත වීසා අයදුම්කරුවන්ට උපදෙස් දෙන තුරු හෝ එක්සත් ජනපදය තුළ තත්ත්වය වෙනස් කිරීමට සුදුසුකම් ලබන්නවුන් දේශීය USCIS කාර්යාලයකට අයැදුම් කරන තුරු හෝ කෙන්ටකි කොන්සියුලර් මධ්‍යස්ථානය (KCC) විසින් මෙම කටයුතු සිදු කරනු ඇත.

### 28. මා දැනටමත් සිටින්නේ එක්සත් ජනපදයේයි. තෝරා ගනු ලැබුවහොත් මගේ තත්ත්වය USCIS සමග සකස් කර ගත යුතුද?

ඔව්. සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ (INA) 245 වැනි වගන්තියේ විධිවිධාන යටතේ භෞතික වශයෙන් එක්සත් ජනපදයේ සිටින තෝරාගනු ලැබූ පුද්ගලයන්ට තත්වය වෙනස් කිරීමට සුදුසුකම් ලබා ඇත්නම් ස්ථිර පදිංචි තත්වයට වෙනස් කර ගැනීමට USCIS ආයතනයට අයැදුම් කළ හැකිය. 2015 සැප්තැම්බර් 30 වන විට DV-2015 වැඩසටහනේ ලියාපදිංචි වීම අවසන් වන බැවින් එදිනට පෙර විදේශීය කලත්‍රයා හා වයස 21ට අඩු දරුවන් ඇතුලුව සියලු දෙනාගේම කටයුතු නිමා කරගත හැකි ආකාරයට ක්‍රියා කිරීමට අයදුම්කරුවන් සහතික විය යුතුය. කිසිදු හේතුවක් නිසාවත් 2015 සැප්තැම්බර් 30 මැදියම් රැයෙන් පසුව (EDT) DV- 2015 වැඩසටහන සඳහා වීසා අංක ලබා දීමක් හෝ තත්ව වෙනස් කිරීමකට අනුමැතිය නොලැබෙනු ඇත.

**29. මම තෝරා ගනු ලැබුව හොත් විවිධත්ව වීසා (DV) සඳහා අයැදුම් කිරීමට කොපමණ කාලයක් ලැබේද?**

DV -2015 වැඩසටහන යටතේ ඔබ තෝරා ගනු ලැබුව හොත් වීසා අයැදුම් කිරීම සඳහා හිමිකම් ඇත්තේ එක්සත් ජනපද රජයේ 2015 මුදල් වර්ෂයේ, එනම් 2014 ඔක්තෝබර් 1 වැනි දින සිට 2015 සැප්තැම්බර් 30 වැනි දින දක්වාය.

සියලුම තෝරාගත් සුදුසුකම් ලැබූ **අයැදුම්කරුවන් DV වීසා ලබා ගැනීම හෝ තත්වය වෙනස් කර ගැනීම මුදල් වර්ෂය අවසන් වන විට සිදු කොට තිබිය යුතුය.** තෝරා ගනු ලැබූ නමුත් 2015 සැප්තැම්බර් 30 වන විට (මුදල් වර්ෂය අවසානයේ) වීසා ලබා නොගත් පුද්ගලයන්ට DV ප්‍රතිලාභ ඊළඟ වර්ෂයට ගෙන යාමට ඉඩක් නැත. තවද, DV-2015 ලියාපදිංචියකින් තත්වය ලබා ගන්නා කලත්‍රයන්ට හා දරුවන්ට DV වර්ගයේ වීසා ලබා ගත හැක්කේ 2014 ඔක්තෝබර් 1 වැනිදා සහ 2015 සැප්තැම්බර් 30 අතර කාලයේදී පමණි. පිටරටවල සිට අයැදුම් කරන අයැදුම්කරුවන්ට, නියම කළ සම්මුඛ සාකච්ඡාවට සති හතරේ සිට හය දක්වා වූ කලකට පෙර, (www.dvlottery.state.gov) වෙබ් අඩවියේ ප්‍රවේශ තත්ව පරීක්ෂාව *(Entrant Status Check)* තුළින් දැන්වීමක් ලැබේ.

**30. DV සඳහා තෝරා ගනු ලැබුවෙකු මියගිය හොත් කුමක් සිදුවේද?**

එක්සත් ජනපදයට පැමිණීමට පෙර තෝරා ගනු ලැබූ පුද්ගලයකුගේ මරණය සිදුවුවහොත් එය ඉබේම අවලංගුවේ. සුදුසුකම් ලැබූ කලත්‍රයා සහ / හෝ දරුවෝ එම තේරීම යටතේ DV වීසා සඳහා තවදුරටත් හිමිකම් නොලබති.

ගාස්තු

**31. E-DV වැඩසටහන සඳහා ඇතුල්වීමට කොපමණ ගෙවීමක් කළ යුතුද?**

**ඉලෙක්ට්‍රොනික අයැදුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා වර්තමානයේ ගාස්තුවක් අය නොකෙරේ.** කෙසේවෙතත් ඔබ තේරී DV වීසා අයැදුම් කරන අවස්ථාවේදී අවශ්‍ය සියලු වීසා ගාස්තු තානාපති කාර්යාලයේ හෝ දූත මණ්ඩල කාර්යාලයේ දූත මණ්ඩල අයකැමිට සෘජුවම ගෙවිය යුතුය. ඔබ එක්සත් ජනපදයේ සිටින අතර තත්වය වෙනස් කිරීමට තෝරාගනු ලැබූ පුද්ගලයෙක් නම් අවශ්‍ය ගාස්තු කෙළින්ම USCIS ආයතනයට ගෙවිය යුතුය. විවිධත්ව වීසා සහ සංක්‍රමණ වීසා අයැදුම් කිරීමේදී අවශ්‍ය කරන ගාස්තු පිළිබඳ විස්තර, තෝරා ගනු ලැබූ අයැදුම්කරුවන්ට E-DV වෙබ් අඩවිය තුළින් ලබා දෙන උපදෙස්වල අඩංගු වේ.

**32. මම තෝරාගනු ලැබුවහොත් විවිධත්ව වීසා හා සංක්‍රමණ ගාස්තු ගෙවන්නේ කෙසේද?**

E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) පරවේශ තත්ව පරීක්ෂාව *(Entrant Status Check)*තුළින් අහුඹු ලෙස තෝරාගත් අයදුම්කරුවන්ට DV වීසා අයදුම් කිරීම පිළිබඳ දැනුම් දීමක් ලැබෙනු ඇත. වීසා අයදුම් කරන අවස්ථාවේදී එක්සත් ජනපද තානාපති කාර්යාලයේදී හෝ දූතමණ්ඩල කාර්යාලයේදී පමණක් සියලු විවිධත්ව හා සංක්‍රමණ වීසා ගාස්තු, ඔබ ගෙවිය යුතු වේ. දූත මණ්ඩල අයකැමිට කරන ලද ගෙවීම සඳහා එක්සත් ජනපද ආණ්ඩුවේ ලදුපතක් වහාම ඔබට ලැබෙනු ඇත. වීසා ඉල්ලුම් කරන තෝරාගත් අයදුම්කරුවන් තැපෑලෙන්, වෙස්ටර්න් යූනියන් හරහා හෝ වෙනත් බෙදාහැරීම් සේවාවක් මගින් DV ගාස්තු සඳහා වූ මුදල් කිසි විට එවිය යුතු නොවේ.

ඔබ දැනටමත් එක්සත් ජනපදයේ සිටින තෝරාගත් අයදුම්කරුවෙක් මෙන්ම USCIS සමග ඔබේ තත්වය වෙනස් කර ගැනීමට බලාපොරොත්තුවන්නේ නම් E-DV වෙබ් අඩවියේ (www.dvlottery.state.gov) පරවේශ තත්ව පරීක්ෂාව (Entrant Status Check) තුළින් ලබාගත

හැකි උපදෙස් පිටුවේ එක්සත් ජනපද බැංකුවකට DV ගාස්තු ගෙවන ආකාරය පිළිබඳව වෙනමම උපදෙස් අඩංගු වේ.

**33. විවිධත්ව වීසාවක් සඳහා අයැදුම් කළත් වීසාවක් ලැබීමට සුදුසුකම් ලබා නැත්නම්, ගෙවන ලද වීසා ගාස්තු මට ආපසු ලබා ගත හැකිද ?**

නැත. වීසා ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම උපදෙස්වල සවිස්තරාත්මකව දක්වා ඇති වීසා සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් ඔබ සපුරා තිබිය යුතුය. ඔබ වීසා අවශ්‍යතා සපුරා නැති බවට හෝ එක්සත් ජනපද නීතිය යටතේ විවිධත්ව වීසාවක් සඳහා සුදුසුකම් ලබා නැති බවට හෝ කොන්සියුලර් නිලධාරියෙක් තීරණය කළහොත් වීසාවක් නිකුත් කළ නොහැකි අතර ගෙවූ සියලුම ගාස්තු ඔබට අහිමි වේ.

## නුසුදුසුකම්

**34. වීසා ලැබීමට නුසුදුසුකම් පිළිබඳ කිසියම් හේතු තිබේ නම් එම අත්හැර දැමීමේ පහසුකම් මට ලබාගත හැකිද? මගේ එවැනි අත්හැර දැමීමේ අයදුම්පතක් සඳහා විශේෂ සැකසුම් ක්‍රමයක් තිබේද?**

නැත. සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ විශේෂිත වශයෙන් දක්වා ඇති සංක්‍රමණ වීසා සඳහා වූ සියලු අයෝග්‍යතා හේතුවලට අයදුම්කරුවෝ යටත් වෙති. පනතේ සාමාන්‍යයෙන් දක්වා ඇති හේතු හැර වෙනත් වීසා ලැබීම අත්හැර දැමීමේ හේතු සඳහා විශේෂ ප්‍රතිපාදන නැත. අත්හැර දැමීම් පිළිබඳ ඉල්ලීම් සඳහා විශේෂ පිරිසැකසුමක් ද නැත. ඇමරිකන් ජාතිකයන් හෝ නීත්‍යානුකූල ස්ථිර පදිංචිකරුවන් හෝ ළඟ නෑයන් වන අයට බලපාන පොදු අත්හැර දැමීමේ ප්‍රතිපාදන, සමහර විවිධත්ව වීසා අයදුම්කරුවන්ටද අදාල විය හැකි වුවද මෙම DV වැඩසටහනේ කාලසීමාවන් නිසා ඒවායින් ප්‍රයෝජන ගැනීම අයැදුම්කරුවන්ට දුෂ්කර විය හැකිය.

## විවිධත්ව වීසා වංචා දැනුම්දීම හා කුටෝපක්‍රම

**35. අන්තර්ජාල වංචා හෝ ඉබේ ලැබෙන ඉ-තැපැල් පිළිබඳව මා පැමිණිලි කරන්නේ කෙසේද?**

කරුණාකර පෙඩරල් වෙළඳ කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යන ජාතීන් 17 ක පාරිභෝගික ආරක්ෂක නියෝජ්‍ය ආයතන වල හවුල් ප්‍රයත්නයක් වන www.econsumer.gov වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. නැතහොත් පෙඩරල් බියුරෝ ඔෆ් ඉන්වෙස්ටිගේෂන් (FBI) Internet Crime Complaint Center වෙත යන්න. අනවශ්‍ය ඉ-තැපෑල පිළිබඳව පැමිණිල්ලක් ගොනු කිරීමට Department of Justice Contact Us page වෙත යන්න.

## විවිධත්ව වීසා (DV) සංඛ්‍යාලේඛන

**36. DV-2015 වැඩසටහන යටතේ වීසා කොපමණ සංඛ්‍යාවක් නිකුත් කරන්නේද ?**

එක්සත් ජනපද විවිධත්ව සංක්‍රමණ වැඩසටහන යටතේ සුදුසුකම් ලත් පුද්ගලයන්ට උපරිම වශයෙන් එක් වර්ෂයකදී ස්ථිර පදිංචි වීසා 55,000ක් ලබාදීමට නීතියෙන් ම ඉඩ සලසා තිබේ. කෙසේ වුවත්, 1997 නොවැම්බර් මාසයේදී කොංගස්‍රය විසින් සම්මත කරන ලද නිකරගුවානු ගැලපුම් හා මධ්‍යම ඇමරිකානු සහන පනත (NACAR) යටතේ DV-1999 දී තරම් කලින් සිට අවශ්‍යවන තාක් කල් වෙන්කරන ලද විවිධත්ව වීසා 55,000 කින් 5,000 දක්වා ප්‍රමාණයක් මෙම NACAR වැඩසටහන යටතේ ප්‍රයෝජනයට ගත හැකි වේ. සත්‍ය වශයෙන්ම මෙම විවිධත්ව වීසා සීමාව 5,000කින් අඩු

කිරීම DV-2000 දී ආරම්භ වූ අතර DV-2015 වැඩසටහන තුළත් එය බල පැවැත්වෙන බැවින් මෙම උපදෙස්වල විස්තර කර ඇති විවිධත්ව වීසා වැඩසටහන සඳහා වීසා 50,000 ක් ඉතිරිවේ

## විවිධ

**37. DV වැඩසටහන මගින් වීසාවක් ලබා ගැනීමට මා සුදුසුකම් ලැබුවහොත් එක්සත් ජනපදයට යාමට එක්සත් ජනපද රජය ගුවන් ගමන් ගාස්තු ලබා දෙන්නේද? නිවාස හා රැකියාවක් ලබා ගැනීමට සහාය වන්නේද? මා ස්ථාවර තත්වයකට පත්වන තෙක් සෞඛ්‍ය පහසුකම් සහ අවශ්‍ය වෙනත් සහනාධාර ලබා දෙන්නේද?**

නැත. DV වැඩසටහන යටතේ වීසාවක් ලැබූ ඔබට එක්සත් ජනපද රජය මෙවැනි කිසිම සේවාවක් සපයන්නේ නැත. DV වීසාවක් සඳහා අයැදුම් කිරීමට ඔබ තේරී ඇත්නම්, ඔබට වීසාවක් නිකුත් කිරීමට පෙර, ඔබ එක්සත් ජනපද රජයට බරක් නොවන බවට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ඒවා නම් ඔබේ පුද්ගලික වත්කම්, එක්සත් ජනපදයේ පදිංචි වී සිටින ඥාතියකුගෙන් හෝ මිතුරකුගෙන් ලබාගත් (I-134 පෝරමය) දිවුරුම් ප්‍රකාශයක් සහ/හෝ එක්සත් ජනපදයේ සේවා යෝජකයකුගෙන් රැකියාවක් පිරිනමන බවට සහතිකයක් යන මේවායේ එකතුවක් විය යුතුය.

**DV - 2015 සඳහා සුදුසුකම් ලබන ස්වදේශිකයන් සිටින රටවල්/ප්‍රදේශ ලැයිස්තුව කලාප වශයෙන්**

මෙම විවිධත්ව වැඩසටහන සඳහා එක් එක් භූගෝලීය ප්‍රදේශ තුළ DV-2015 සඳහා සුදුසුකම් ලබන ස්වදේශිකයන් සිටින රටවල් පහත සඳහන් ලැයිස්තුවෙන් පෙන්නුම් කෙරේ. යටත් ප්‍රදේශ, පාලක රටෙහි ප්‍රදේශය තුළ ඇතුළත් කෙරේ. DV-2015 වැඩසටහන සඳහා සුදුසුකම් නොලබන ස්වදේශිකයන් සිටන රටවල්, සංක්‍රමණ හා ජාතිකත්ව පනතේ 203 (ඇ) වගන්තියෙහි සූත්‍රයට අනුව එක්සත් ජනපද පුරවැසි හා සංක්‍රමණ සේවා (USCIS) ආයතනය විසින් හඳුනා ගෙන ඇත. මෙම විවිධත්ව වැඩසටහන සඳහා සුදුසුකම් නොලබන රටවල් (ඒවා පවුල් අනුග්‍රහය ලබන සහ රැකියා පදනම් වූ සංක්‍රමණ සම්බන්ධයෙන් ඉහළ ඇතුල් වීමක් ඇති රටවල් නිසාය) අදාළ කලාපීය ලැයිස්තුවලට පසුව සඳහන් කෙරේ

__අප්‍රිකාව__

ඇල්ජීරියාව
ඇංගෝලාව
බෙනින්
බොට්ස්වානා
බුර්කිනා ෆාසෝ
බුරුන්ඩි
කැමරූන්
කේප්වර්ඩ්
මධ්‍යම අප්‍රිකානු සමූහාණ්ඩුව
චැඩ්
කොමොරොස්
කොංගෝව
කොංගෝ ප්‍රජාතාන්ත්‍රික සමූහාණ්ඩුව
කෝට් ඩි අයිවොරි (අයිවරිකෝස්ට්)
ජිබුටි
ඊජිප්තුව*
නිරක්ෂීය ගිනි
එරිත්‍රියාව
ඉතියෝපියාව
ගැබොන්
ගැම්බියාව
ඝානාව
ගිනියාව
ගිනි-බිසව්
කෙන්යාව
ලෙසොතෝ
ලයිබීරියාව
ලිබියාව
මැඩගස්කරය
මලාවි
මාලි
මොරිටේනියාව
මොරීෂස්
මොරොක්කෝව
මොසැම්බික්
නැමීබියාව
නයිගර්
රුවන්ඩා
සා ඕ-ටොමේ සහ ප්‍රින්සිපෙ
සෙනෙගාලය
සීෂෙල්ස්
සියරා ලියොන්
සෝමාලියාව
දකුණු අප්‍රිකාව
දකුණු සුඩානය
සුඩානය
ස්වාසිලන්තය
ටැන්සානියාව
ටෝගෝ
ටියුනීසියාව
උගන්ඩාව
සැම්බියාව
සිම්බාබ්වේ

*1967 ජූනි මාසයට පෙර ඊශ්‍රාලය, ජෝර්දානය, සිරියාව හා ඊජිප්තුව පාලනය කළ ප්‍රදේශවල උපන් අයට අදාල රට වන්නේ පිළිවෙළින් ඊශ්‍රාලය, ජෝර්දානය, සිරියාව හා ඊජිප්තුවයි. ගාසා තීරුවේ උපන් අයට අදාල රට වන්නේ ඊජිප්තුවයි. බටහිර ඉවුරේ උපන් අයට අදාළ රට ජෝර්දානය වන අතර ගොලාන් කඳුකරයේ උපන් අයට අදාළ රට වන්නේ සිරියාවයි.

අප්‍රිකාවේ නයිජීරියාවේ වැසියන් මෙම වර්ෂයේ විවිධත්ව වැඩසටහන සඳහා සුදුසුකම් නොලබති.

## DV - 2013 සඳහා සුදුසුකම් ලබන ස්වදේශිකයන් සිටින රටවල් ලැයිස්තුව කලාප වශයෙන්

**<u>ආසියාව</u>**

ඇෆ්ගනිස්තානය
බහරේන්
භූතානය
බෲනායි
බුරුමය
කාම්බෝජය
හොංකොං විශේෂ පරිපාලන ප්‍රදේශය**
ඉන්දුනීසියාව
ඉරානය
ඉරාකය
ඊශ්‍රාලය*
ජපානය
සිංගප්පූරුව
ශ්‍රී ලංකාව
සිරියාව *
තායිවානය**
ජෝර්දානය*
කුවයිට්
ලාඕසය
ලෙබනනය
මැලේසියාව
මාලදිවයින
මොංගෝලියාව
නේපාලය
උතුරු කොරියාව
ඕමානය
ක්ටාර්
සෞදි අරාබිය
තායිලන්තය
ටිමෝර්-ලෙස්ට්
එක්සත් අරාබි එමීර් රාජ්‍යය
යේමනය

*1967 ජුනි මාසයට පෙර ඊශ්‍රාලය, ජෝර්දානය, සිරියාව හා ඊජිප්තුව පාලනය කළ ප්‍රදේශවල උපන් අයට අදාල රට වන්නේ පිළිවෙළින් ඊශ්‍රාලය, ජෝර්දානය, සිරියාව හා ඊජිප්තුවයි. ගාසා තීරුවේ උපන් අයට අදාල රට වන්නේ ඊජිප්තුවයි. බටහිර ඉවුරේ උපන් අයට අදාළ රට ජෝර්දානය වන අතර ගොලාන් කඳුකරයේ උපන් අයට අදාළ රට වන්නේ සිරියාවයි

**පහත සඳහන් ආසියානු රටවල ස්වදේශිකයෝ මෙම වර්ෂයේ විවිධත්ව වැඩසටහන සඳහා සුදුසුකම් නොලබති: <u>බංගලාදේශය</u>, චීනය (ප්‍රධාන රටේ උපන්) ඉන්දියාව, පකිස්තානය, දකුණු කොරියාව, පිලිපීනය සහ වියට්නාමය. හොංකොං විශේෂ පරිපාලන ප්‍රදේශය,(ආසියා කලාපය) මැකාවු විශේෂ පරිපාලන පද්‍රේශය(යුරෝපීය කලාපය) සහ තායිවානය (ආසියා කලාපය) සුදුසුකම් ලබන අතර ඉහළ ලැයිස්තුගත කර ඇත.

**<u>යුරෝපය</u>**

ඇල්බේනියාව
ඇන්ඩෝරාව
ආර්මීනියාව
ඔස්ට්‍රියාව
අසර්බයිජානය
බෙලාරුස්
බෙල්ජියම
බොස්නියා සහ හර්සෙගෝවිනා
ලිතුවේනියාව
ලක්සම්බර්ග්
මැකාවු විශේෂ පරිපාලන ප්‍රදේශය**
මැසිඩෝනියාව
මෝල්ටාව
මෝල්ඩෝව
මොනාකෝ
මොන්ටිනීග්‍රෝ

බල්ගේරියාව
ක්‍රොඒෂියා
සයිප්‍රස්
චෙක් සමූහාණ්ඩුව
ඩෙන්මාර්ක් (සංරචක සහ විදේශ යටත් ප්‍රදේශ ඇතුළුව)
එස්තෝනියාව
පින්ලන්තය
ප්‍රංශය (සංරචක සහ විදේශ යටත් ප්‍රදේශ ඇතුළුව)
ජෝර්ජියාව
ජර්මනිය
ග්‍රීසිය
හංගේරියාව
අයිස්ලන්තය
අයර්ලන්තය
ඉතාලිය
කසක්ස්තාන්
කොසෝවෝ
කිර්ගිස්තාන්
ලැට්වියා
ලීචෙන්ස්ටෙන්
නෙදර්ලන්තය (සංරචක සහ යටත් ප්‍රදේශ ඇතුළුව)
උතුරු අයර්ලන්තය**
නෝර්වේ
පෝලන්තය
පෘතුගාලය (සංරචක සහ විදේශ යටත් ප්‍රදේශ ඇතුළුව)
රොමේනියාව
රුසියාව
සැන්මැරිනෝ
සර්බියාව
ස්ලෝවැකියාව
ස්ලෝවෙනියාව
ස්පාඤ්ඤය
ස්වීඩනය
ස්විට්සර්ලන්තය
තජිකිස්තාන්
තුර්කිය
ටර්ක්මෙනිස්තාන්
උක්රේනය
උස්බෙකිස්තානය
වතිකානු නගරය

**පහත දැක්වෙන යුරෝපීය රටවල ස්වදේශිකයන් මෙම වර්ෂයේ විවිධත්ව වැඩසටහන සඳහා සුදුසුකම් නොලබති. මහා බ්‍රිතාන්‍යය (එක්සත් රාජධානිය) මහා බ්‍රිතාන්‍යයට (එක්සත් රාජධානිය) පහත සඳහන් යටත් පළ්දේශ ඇතුලත් වේ : ඇංගිලා, බර්මුඩා, බ්‍රිතාන්‍ය වර්ජින් දූපත්, කේමන් දූපත්, ෆොක්ලන්ඩ් දූපත්, ජිබ්‍රෝල්ටා, මොන්සෙරාට්, පිට්කයින්, සාන්ත හෙලේනා, ටර්කස් සහ කයිකෝස් දූපත්. විවිධත්ව වැඩසටහන සඳහා පමණක්, උතුරු අයර්ලන්තය වෙනම සලකනු ලැබෙන බවද, උතුරු අයර්ලන්තය සුදුසුකම් ලබන බවත් එය සුදුසුකම් ලබන පළ්දේශ අතර ලැයිස්තු ගත කර ඇති බව ද සළකන්න මකාවු විශේෂ පරිපාලන ප්‍රදේශයද සුදුසුකම් ලබන අතර එය ඉහත ලැයිස්තු ගතකර තිබේ..

## උතුරු ඇමෙරිකාව

බහමාස්
උතුරු ඇමෙරිකාවේ, කැනඩාවේ සහ මැක්සිකෝවේ ස්වදේශිකයෝ මෙම වර්ෂයේ විවිධත්ව වැඩසටහනට සුදුසුකම් නොලබති.

## ඕෂනියාව

ඕස්ට්‍රේලියාව (සංරචක සහ පිටරට යටත් ප්‍රදේශ ඇතුළුව)
ෆීජී
කිරිබටි
මාෂල් දූපත්
මයික්‍රෝනිසියා ෆෙඩරල් රාජ්‍ය
නාඋරු
නිවසීලන්තය (සංවරක සහ පිටරට යටත් ප්‍රදේශ ඇතුළුව)
පලාවු
පැපුවා නිව්ගිනියා
සොලමන් දූපත්
ටොංගා
ටුවාලූ
වනුඅටු
සැමෝවා

## දකුණු ඇමරිකාව, මධ්‍යම ඇමරිකාව සහ කැරිබියන් දූපත්

ඇන්ටිගුආ සහ බාබුඩා
ආජෙන්ටිනාව
බාබඩෝස්
බෙලීසී
බොලිවියා
චිලී
කොස්ටාරිකා
කියුබා
ඩොමිනිකා
ග්‍රැනඩා
ගෝතමාලාව
ගුයනා
හොන්ඩියුරාස්
නිකරගුආ
පැනමා
පැරගුවේ
සැන්ට් කිට්ස් සහ නේවිස්
සැන්ට් ලූසියා
සැන්ට් වින්සන්ට් සහ ග්‍රැනඩයින්ස්
සුරිනාම්
ට්‍රිනිඩෑඩ් සහ ටොබාගෝ
උරුගුවේ
වෙනිසියුලාව

මේ වර්ෂයෙහි විවිධත්ව වැඩසටහන සඳහා ස්වදේශිකයන් සුදුසුකම් නොලබන මෙම කලාපයේ රටවල් : බ්‍රසීලය, කොලොම්බියාව, ඩොමිනිකන් සමූහාණ්ඩුව, ඉක්වදෝරය, එල්සැල්වදෝරය, හයිටි, ජැමෙයිකාව, මැක්සිකෝව සහ පේරු.